2024



Performance REPORT

කාර්යසාධන වාර්තාව | செயலாற்றுகை அறிக்கை

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
நீதி மற்றும் தேசிய ஒருமைப்பாடு அமைச்சு
Ministry of Justice and National Integration

කාර්යසාධන වාර්තාව - 2024

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

වැය ශීර්ෂ 110 සහ 228

අන්තර්ගතය

		පිටු අංක
පරිච්ඡේදය 01	- ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	05
පරිච්ඡේදය 02	- ප්‍රගතිය හා ඉදිරි දැක්ම	12
පරිච්ඡේදය 03	- වසරේ මූල්‍ය කාර්ය සාධනය	27
පරිච්ඡේදය 04	- කාර්ය සාධන දර්ශක	92
පරිච්ඡේදය 05	- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	96
පරිච්ඡේදය 06	- මානව සම්පත් පැතිකඩ	101
පරිච්ඡේදය 07	- අනුකූලතා වාර්තාව	108

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

රටේ නීති ක්ෂේත්‍රය සහ අධිකරණ ක්ෂේත්‍රයේ වගකීම් දරන දෙපාර්තමේන්තු හා ආයතන සමුදායකින් යුක්තව මෙම අමාත්‍යාංශය පිහිටුවා ඇත. ඒ අනුව කලින් කලට අමාත්‍යාංශයේ විෂය පථය වෙනස් වුවද නීති ප්‍රතිසංස්කරණයේත්, මහජනතාවගේ යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණය සඳහා පහසුකම් සැලසීමේත් ප්‍රමුඛතම ආයතනය වශයෙන් මෙම අමාත්‍යාංශය ආරම්භයේ සිට මේ දක්වා ක්‍රියාත්මක වේ. විශේෂයෙන් මෙම අමාත්‍යාංශයේ සුවිශේෂත්වය වන්නේ 110 සහ 228 ලෙස වැය ශීර්ෂ දෙකක වගකීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත පවරා තිබීමයි.

අපරාධකරුවන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට හා පුරවැසියන්ගේ සිවිල් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ඉවහල්වන ප්‍රධාන නීති ඇතුළුව වැදගත් නීති රාශියක වගකීම මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ. ඒ අනුව එම නීතීන් කාලීන හා සමාජ අවශ්‍යතාවයන්ට අනුව සංශෝධනයත්, නව නීති හඳුන්වා දීමත් මෙම අමාත්‍යාංශයෙන් සිදු කෙරේ. මීට අමතරව වෙනත් ආයතනවලට අයත් විෂය පථයන්ගේ නීති සංශෝධනයන් සිදු කිරීම සඳහා විශාල කාර්යයභාරයක් මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක නීතිපති දෙපාර්තමේන්තුව සහ ව්‍යවස්ථානුකූල සහතිකය හා උපදෙස් ලබා දෙමින් කෙටුම්පත් සකස්කර දෙමින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව මගින් සිදු කරයි.

යුක්තිය පසිඳලීම සඳහා පහසුකම් සැපයීමත් අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමත් අමාත්‍යාංශයේ අනෙක් ප්‍රමුඛතම වගකීමයි. අධිකරණ පරිපාලනය සඳහා අමාත්‍යාංශය විසින් සෑමවිටම පූර්ණ සහයෝගීතාවය අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත දක්වනු ලබයි. මේවන විට ගැසට්කර තිබෙන අධිකරණ කලාප 34ක තිබෙන අධිකරණ 264ක් හා කම්කරු විනිශ්චය සභා 39කට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමේ කටයුතු අමාත්‍යාංශය විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව අධිකරණ ගොඩනැගිලි නඩත්තුව, නවීකරණය සහ අවශ්‍යතාවය අනුව නව ගොඩනැගිලි ඉදිකිරීමටත් කටයුතු කරනු ලැබේ. එසේම විනිශ්චයකාරවරුන්ට ස්වාධීනව අභිමානයෙන් යුක්තව සිය රාජකාරි ඉටුකිරීම සඳහා සුදුසු නේවාසික පහසුකම් සැපයීම, විනිසුරු නිල නිවාස ඉදිකිරීම හා නඩත්තු කිරීම් කටයුතුද සිදු කරනු ලැබේ. එසේම ඔවුන්ගේ සන්නිවේදන හා ප්‍රවාහන පහසුකම් නිසියාකාරයෙන් සැපයීමේ කාර්යය ද අමාත්‍යාංශය විසින් සිදු කරනු ලැබේ.

අධිකරණ පද්ධතිය තුළ යුක්තිය පසිඳලීමේ ප්‍රමාදයන් වැළැක්වීම මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන වගකීමක් කොට දක්වා ඇත. ඒ අනුව අධිකරණය වෙත ගොඩගැසෙන නඩු ප්‍රමාණය අවම කිරීම සඳහා සමථ මණ්ඩල කොමිෂන් සභාව, ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව සහ ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය වැනි විකල්ප ගැටලු විසඳීමේ යාන්ත්‍රණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. එසේම ආණ්ඩුවේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුවේ විශේෂඥ විද්‍යාත්මක සාක්ෂි සැපයීම යුක්තිය පසිඳලීම කඩිනම් කිරීමට ඉතාමත් වැදගත් වේ.

එසේම නීතියේ පිළිසරණ ලබාගත නොහැකි ජනතාව වෙනුවෙන් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව විසින් සෑම පුරවැසියෙකුටම නීතියට ප්‍රවේශය සඳහා සම අවස්ථා ලබා දීම වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කරයි. අපරාධකරුවන් වැරදිකරුවන් කිරීම සඳහා අධිකරණවලදී සාක්ෂි දීමට සාක්ෂිකරුවන් දිරිමත් කිරීමට අපරාධයක වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය කටයුතු කරනු ලබයි. එසේම සාම විනිසුරුවරුන්, හදිසි මරණ පරීක්ෂකවරුන්, දිවුරුම් කොමසාරිස්වරුන්, සහ දිවුරුම් දුන් භාෂා පරිවර්තකයින් පත් කිරීමේ හා පරිපාලනය කිරීමේ කටයුතු ද මෙම අමාත්‍යාංශය මගින් සිදු කරයි.

1.2 <u>ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු</u>

දැක්ම (Vision)

මහජනතාව විශ්වාස කරන නීති පද්ධතියක් - සාධාරණ ශ්‍රී ලංකාවක්

අරමුණු (Purpose)

ජනතාව කේන්ද්‍ර කරගත් කාර්යක්ෂම අධිකරණ පරිපාලනය මගින් ශ්‍රී ලංකාවේ ජනතාව සඳහා ස්ථාවර, සාධාරණ සහ නිදහස් පරිසරයක් ඇති කිරීම සඳහා

- ඵලදායී හා කාලෝචිත නීති ප්‍රසංස්කරණ,
- ප්‍රතිපත්ති සංවර්ධන මුලපිරීම්,
- ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සහ සම්බන්ධ වීම සහ
- ප්‍රජා නීති සේවා

වටිනාකම්

- අඛණ්ඩතාව
- විශ්වාසය
- අන්තර්ගත කිරීම
- විනිවිද බව
- වගවීම

පරමාර්ථ

- යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණය සවිබල ගැන්වීම
- නීති ප්‍රතිසංස්කරණය ප්‍රවර්ධනය කිරීම හා නීති පැනවීම
- නීතියේ ආධිපත්‍ය ප්‍රවර්ධනය කිරීම සහ සැමට යුක්තිය උදෙසා ප්‍රවේශය සඳහා වූ සම අවස්ථාවන් සුරක්ෂිත කිරීම
- තම කාර්යයන් කාර්යක්ෂම ලෙස සිදු කර ගෙන යාම සඳහා අධිකරණවල හිතකර පරිසරයක් නිර්මාණය කිරීම
- මහජනතාව වෙත කඩිනම් සහ වඩා හොඳ සේවාවක් ලබා දීමේ මුඛ්‍ය පරමාර්ථයෙන් යුතුව අධිකරණයන්හි නඩු විභාග කිරීමේ සහ විසඳුම් ලබා දීමේ පවතින ප්‍රමාදයට විසඳුම් ලබා දීම
- පුහුණුවීම් තුළින් අධිකරණ සේවයෙහි කාර්යක්ෂමතාවය සහ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම
- විකල්ප ආරවුල් විසඳීමේ ක්‍රමවේද ශක්තිමත් කිරීම
- අපරාධවලට ගොදුරු වූවන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් සකස් කිරීම, තහවුරු කිරීම, බලාත්මක කිරීම සහ එවැනි අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය , ආරක්ෂා කිරීම, බලාත්මක කිරීම සහ ක්‍රියාවේ යෙදවීම සඳහා යාන්ත්‍රණයක් සැපයීම
- තම ආර්ථික, සමාජීය තත්ත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, කුළය, හෝ ජාතිකත්වය හෝ ආබාධිත බව පිළිබඳ භේදයකින් තොරව ලැබිය යුතු සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා යුක්තිය උදෙසා ප්‍රවේශ වීමට සම අවස්ථාවන් ලබා දෙන සමාජයක් නිර්මාණය කිරීමට යුක්තිය උදෙසා සම ප්‍රවේශයක් ඇති කිරීම.
- සමාජය තුළ සංහිඳියාව සහ සහජීවනය සාක්ෂාත් කරගැනීම
- බන්ධනාගාර තදබදය අවම කිරීම
- අධිකරණ අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන දෙපාර්තමේන්තු හා ආයතනවල කාර්යක්ෂමතාවය සහ ගුණාත්මක භාවය ඉහළ නැංවීම


1.3 <u>අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්</u>

අධිකරණ, සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යයන් කලින් කලට අමාත්‍යාංශ වෙත විෂය පැවරීම සංශෝධනයත් සමඟ වෙනස් වන අතර 2024.11.25 දිනැති ගැසට් පත්‍රය අනුව පහත කාර්යයන් මෙම අමාත්‍යාංශයට පැවරී ඇත.

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා අධිකරණ, ජාතික ඒකාබද්ධතා විෂයන්ට සහ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.
- නාස්තිය හා දූෂණය පිටුදකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියළුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- සමාජ අවශ්‍යතාවයන් සහ ගෝලීය ප්‍රවණතාවන් සැලකිල්ලට ගෙන නීති පද්ධතියට අවශ්‍ය කරනුලබන ප්‍රතිසංස්කරණ සිදු කිරීම.
- නීතිය නැවත ලේඛනගත කිරීම හා සංග්‍රහගත කිරීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් වෙනත් කිසිවෙකු වෙත පවරා දෙනු නොලැබූ යුක්තිය පසිඳලීමේ අධිකරණයන්හී පරිපාලනය පිළිබඳ කටයුතු.
- උසාවි පද්ධතිය තුළ යුක්තිය පසිඳලීමේ ප්‍රමාදයන් වැළැක්වීම ඇතුළුව සමස්ථ පරිපාලනයට අදාළ සියළු කටයුතු ක්‍රමවත්ව හා කාර්යක්ෂමව ඉටු කිරීම හා ඒ සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීම.
- රජය වෙනුවෙන් අපරාධ නඩු පැවරුම් හා සිවිල් නීති කටයුතු.
- රජයට සහ සියළුම රජයේ දෙපාර්තමේන්තුවලට නීති උපදෙස් ලබාදීම.
- නීති කෙටුම්පත් කිරීම.
- යම් වරදකරුවෙකුට නියම කරනු ලැබූ දඬුවම් සම්බන්ධයෙන් සමාව දීම, අඩු කිරීම, ලිහිල් කිරීම, ප්‍රමාද කිරීම හා අත්හිටුවීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම.
- සමස්ථ ක්වාසි පද්ධතියේ ඵලදායීතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම පිණිස සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- කම්කරු විනිශ්චය සභා පරිපාලනය සහ ඊට අදාළ අනෙකුත් කටයුතු.
- සිවිල් ආරවුල්, අධිකරණය දක්වා නොගොස් විසඳා ගැනීම සඳහා සමථ මණ්ඩල ක්‍රියාවලිය බල ගැන්වීම.
- නීතිය ක්‍රියාත්මක කිරීමේ පටිපාටි සහ යාන්ත්‍රණය පිළිබඳව අදාළ පුද්ගලයන්ට අවශ්‍ය නවීන දැනුම හා තාක්ෂණික පුහුණුව ලබාදීම.
- අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීම සහ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- ජනතා පරමාධිපත්‍ය හා ජාතික ආරක්ෂාව තහවුරු වන බවට සහතික වෙමින් කාලීන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට පියවර ගැනීම.

- නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීමට අදාළ කටයුතු සිදු කිරීම.
- බන්ධනාගාර ප්‍රතිසංස්කරණයට අදාළ ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- බන්ධනාගාර පරිපාලනය හා ප්‍රතිසංස්කරණය.
- බන්ධනාගාරවල යටිතල පහසුකම් සංවර්ධනය හා තදබදය අඩු කිරීම.
- බන්ධනාගාරගත වූවන් පුනරුත්ථාපනය කිරීම.
- ප්‍රජාපාදක විශෝධන ව්‍යාපෘති සම්බන්ධ කටයුතු.
- අර්බුද හේතුවෙන් ශාරීරික හා මානසික ආබාධවලට ලක් වූ පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීමට වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ත්‍රස්තවාදී ක්‍රියාවන්හී යෙදී සිටි තැනැත්තන් නැවත සමාජගත කිරීම සඳහා වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම.
- අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ආයතන දෙපාර්තමේන්තු හා අංශයන් අධීක්ෂණය කිරීම.

1.4 <u>සංවිධාන සටහන</u>


අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
සංවිධාන ව්‍යුහය 2024
ලේකම්
අති ගරු (ආචාර්ය කාවිඳු ජයවර්ධන)
අති ගරු (ආර්.එම්.කේ.බී. රත්නායක)
අති ගරු (ඩී.එම්.ස්වාමිනාථන්)
අති ගරු (ඩී.බී.ගුණසේකර)
අති ගරු (ඩී.එම්.කේ.බී. දිසානායක)
අති ගරු (ජනාධිපතිතුමා)
අති ගරු (ජනාධිපතිතුමා)
අති ගරු (ජනාධිපතිතුමා

1.5 මෙම අමාත්‍යාංශයේ ලේකම් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීවන දෙපාර්තමේන්තු

01. නීතිපති දෙපාර්තමේන්තුව
02. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
03. ශ්‍රී ලංකා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව
04. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
05. ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය
06. ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව
07. බන්ධනාගාර දෙපාර්තමේන්තුව
08. ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව
09. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

1.6 අනෙකුත් ආයතන

වැය ශීර්ෂ (110)

01. සමථ මණ්ඩල කොමිෂන් සභාව
02. අධිකරණ නොවන නිලධාරීන් සඳහා පුහුණු කිරීමේ ආයතනය
03. ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව
04. අපරාධයක චින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය
05. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය
06. ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය
07. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
08. හානිපූර්ණය සඳහා වන කාර්යාලය
09. පුනරුත්ථාපන කාර්යාංශය
10. රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
11. ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය

වැය ශීර්ෂ (228)

01. උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය
02. කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය

***නීති විද්‍යාලය**

නීති විද්‍යාලයද මෙම අමාත්‍යාංශය යටතේ ගැසට් කර තිබෙන අතර ඒ සඳහා 110 හෝ 228 වැය ශීර්ෂ වලින් ප්‍රතිපාදන ලබා දීමක් සිදු නොකෙරේ.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	ව්‍යාපෘති කාල සීමාව
1) ඵලදායී සහ කාර්යක්ෂම යුක්තිය ක්‍රියාකාරකම් ව්‍යාපෘතිය	USAID - EEJ	US$ 15Mn	2022-2026
2) යුක්තියට සහය වීම සඳහා ව්‍යාපෘති - EU – SJS/JURE	EU/SJS/JURE	Euro 19.4Mn	2022-2026
3) ඵලදායීව ආරවුල් විසඳීම සඳහා සමථ මණ්ඩල කොමිෂන් සභාවට සහය වීම	EU / SEDR	Euro 07 MN	2020-2024
4) වෝහාරික ඖෂධ විශ්ලේෂණය පිළිබඳ ශක්නුතාව ශක්තිමත් කිරීම , ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති ක්‍රමය පිළිබඳ විශ්ලේෂණය	KOICA	Rs 793 Mn	2021-2024
5) ශ්‍රී ලංකාව තුළ යුක්තිය සඳහා සාධාරණ ප්‍රවේශය ශක්තිමත් කිරීම	JICA	JPY 60MN	2023-2025
6) යාපනය දිස්ත්‍රික්කයේ වැසි ජලය රැස් කිරීමේ ටැංකි 2,889ක් ඉදිකිරීම	Indian High Commission	SLRs 421.87 Mn	2017-2024
7) ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ දුරස්ථ ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම, මාර්ගගත නඩු විභාග සහ ජංගම අධිකරණ	UNODC	US$ 1200 Mn	2023-2025

02.පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම
විශේෂ, ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

මෙම අමාත්‍යාංශයේ වගකීම තවදුරටත් පුළුල් කරමින් 2024.11.25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන 24ක වගකීම් පවරන ලදී. ඒ අනුව පහත පරිදි ප්‍රමුඛ ක්ෂේත්‍ර යටතේ 2024 වර්ෂයේ ප්‍රගතිය සාරාංශගතව ඉදිරිපත් කළ හැකිය.

2.1 ප්‍රගතිය

2.1.1 නීති ප්‍රතිසංස්කරණ

2024 වර්ෂය තුළ මෙම අමාත්‍යාංශ විෂයපථයට අදාළව නීති ප්‍රතිසංස්කරණ 13ක් පාර්ලිමේන්තුවේ සම්මත වී ඇති අතර රීති නියෝග 5ක් පාර්ලිමේන්තුවේ සම්මත කර ගැසට් කර ඇත.

පාර්ලිමේන්තුව මඟින් සම්මත කරන ලද පනත්

	පනතේ නම	කතානායකවරයා විසින් සහතික කළ දිනය
1)	2024 අංක 1 දරණ ජාතික සමගිය, සහ ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලයීය පනත.	2024.01.23
2)	2024 අංක 2 දරණ සමථ මණ්ඩල (සංශෝධන) පනත.	2024.01.23
3)	2024 අංක 3 දරණ ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) ආඥා පනත.	2024.01.23
4)	2024 අංක 4 දරණ වංචා වැළැක්වීමේ (සංශෝධන) ආඥා පනත.	2024.01.23
5)	2024 අංක 5 දරණ සමථකරණය තුළින් ඇති වන්නාවූ අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම් පිළිගැනීමේ සහ බලාත්මක කිරීමේ පනත.	2024.01.31
6)	2024 අංක 6 දරණ නොතාරිස් (සංශෝධන) ආඥා පනත.	2024.01.31
7)	2024 අංක 7 දරණ ජාතික ජල ශාස්ත්‍රීය පනත.	2024.02.01
8)	2024 අංක 8 දරණ අධිකරණයට, විනිශ්චයාධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීම පිළිබඳ පනත.	2024.02.01
9)	2024 අංක 25 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත.	2024.05.03
10)	2024 අංක 27 දරන බෙදුම් නඩු (සංශෝධන) පනත.	2024.05.13
11)	2024 අංක 43 දරණ සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත	2024.08.02
12)	2024 අංක 49 දරණ විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත	2024.09.13
13)	2024 අංක 50 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත	2024.09.13

පාර්ලිමේන්තුව සම්මත කර ඇති රීති, නියෝග, රෙගුලාසි සහ ගැසට් පත්‍ර

මාතෘකාව	වර්තමාන තත්ත්වය
01. අධිකරණ සංවිධාන පනත (දූෂණ විරෝධී පනතට අදාළ රෙගුලාසි)	2024.02.21 වන දින පාර්ලිමේන්තුව සම්මත කර ඇත.
02.උතුරු නැගෙනහිර පළාත්වල මුදල් (ප්‍රඥප්ති) පිළිබඳව 1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනතේ රෙගුලාසි	2024.02.21 වන දින පාර්ලිමේන්තුව සම්මත කර ඇත.
03.1978 අංක 02 දරණ අධිකරණ සංවිධාන පනතේ රෙගුලාසි.	2024.07.23 වන දින පාර්ලිමේන්තුව සම්මත කර ඇත.
04.2023 විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (නඩු භාණ්ඩ බැහැර කිරීම) පිළිබඳ නියෝග	2024.04.24 වන දින පාර්ලිමේන්තුව සම්මත කර ඇත.
05.2024 අංක 5 දරන සමථකරණය තුළින් ඇතිවන්නාවූ අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම් පිළිගැනීමේ සහ බලාත්මක කිරීමේ පනත - 1 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේවූ නියමය	2024.07.17 ගැසට් පත්‍රයේ පලකර ඇත

නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව පහත නීති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් 2024 වර්ෂය තුළ කටයුතු කර ඇත.

I. බංකොලොත්භාවය පිළිබඳ නීති ප්‍රතිසංස්කරණ.

II 2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනතේ විධිවිධාන සංශෝධනය කිරීම.

III. හවුල් ව්‍යාපාර නීතියට අදාළ සංශෝධන.

IV 2024 අංක 43 දරන පනතින් ඇති කරන ලද විෂමතා ඉවත් කිරීම.

නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂය තුළ පහත පරිදි නීති කෙටුම්පත් සකස් කර ඇත

රාජකාරි ස්වභාවය	2024.12.31 දිනට කෙටුම්පත් සකස් කර භාෂාත්‍රයෙන් අදාළ පාර්ශවයන් වෙත ලබා දුන් සංඛ්‍යාව
පනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති)	60
පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත්	8
උපකාරක නීති ප්‍රතිශෝධනය	124
පළාත්සභා ප්‍රඥප්ති	0
එකතුව	192

2.1.2 යටිතල පහසුකම් සංවර්ධනය

2024 වර්ෂයේ ගොඩනැගිලි හා ව්‍යුහයන් සම්බන්ධයෙන් වෙන් කල ප්‍රතිපාදනවල සාරාංශය පහත පරිදි වේ.

	2024 වසර සඳහා සංශෝධිත ප්‍රතිපාදන (රු.මි.)	2024.12.31 දිනට වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය%
වැය ශීර්ෂ 110- අධිකරණ පියස	2,250.00	2,250.00	100%
වැය ශීර්ෂ 228- මහා පරිමාණ ව්‍යාපෘති	701.80	682.00	97.18%
වැය ශීර්ෂ 228- සුළු පරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති	60.00	53.75	89.58%
වැය ශීර්ෂ 228- තුන් අවුරුදු සැලැස්ම	318.00	318.00	100%
වැය ශීර්ෂ 228- ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති	667.00	588.00	88.15%
එකතුව	**3,996.80**	**3,891.75**	**97.35%**

2024 වර්ෂය තුළ අවසන් කරන ලද ව්‍යාපෘති පහත පරිදි වේ.

ව්‍යාපෘතිය	**ඇස්තමේන්තුව (රු.මි.)**	**2024 වසරේ වියදම (රු.මි.)**	**සටහන**
කුරුණෑගල ද්විත්ව නිල නිවාස ඉදි කිරීම.	53.15	9.09	වැය වී ඇති මුදල රු.මි. 51.6කි.
තෙල්දෙණිය අධිකරණ සංකීර්ණය ඉදි කිරීම.	599.88	43.19	වැය වී ඇති මුදල රු.මි. 406.2කි. අධිකරණ සංකීර්ණය විවෘත කර ඇත. අවසන් බිල්පත්‍රය ඉදිරිපත් කර නොමැත.
ගම්පොළ අධිකරණ විනිසුරුවරුන් සඳහා නිල නිවාස ඉදිකිරීම.	73.12	30.00	වැය වී ඇති මුදල රු.මි. 81.37කි. අවසන් බිල්පත්‍රය ඉදිරිපත් කර නොමැත.

***විචලනය හා වැඩි වූ වැට ප්‍රතිශතය ද මෙහි අනතර්ගත වේ.**



තෙල්දෙණිය අධිකරණ සංකීර්ණය ඉදිකිරීම



කුරුණෑගල ද්විත්ව නිල නිවාස ඉදි කිරීම.



ගම්පොළ අධිකරණ විනිසුරුවරුන් සඳහා නිල නිවාස

2.1.3. යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට සෘජුව සම්බන්ධ ආයතන

නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

ශාඛාව	2024 වර්ෂය තුළ දක්වා පවරන ලද නඩු ගොනු සංඛ්‍යාව	2024 වර්ෂය තුළ දක්වා අවසන් කරන ලද නඩු ගොනු සංඛ්‍යාව	2024 වර්ෂය තුළ දක්වා අවසන් කරන ලද නඩු ගොනු සංඛ්‍යාව
සිවිල්	3,466	564	2,902
රාජ්‍ය නීතීඥ	131	07	124
අපරාධ	3,205	767	2,438
ශ්‍රේෂ්ඨාධිකරණ	470	79	391
සංස්ථා	2,549	284	2,265
ළමා අපචාර නඩු විමර්ශන අංශය	2,301	395	1,906
මහජන පෙත්සම්	1,409	1,077	332
එකතුව	13,531	3,173	10,358

රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ

2024.01.01 සිට 2024.12.31 දක්වා විශ්ලේෂණ වාර්තාවල ප්‍රගතිය

අංශය	2024.01.01 දිනට නඩු සංඛ්‍යාව	වර්ෂය තුළ ලැබුණු නඩු සංඛ්‍යාව	වර්ෂය තුළ වාර්තා කල නඩු සංඛ්‍යාව	2024.12.31 දිනට වාර්තා නොකල නඩු සංඛ්‍යාව
මත්ද්‍රව්‍ය හා මනෝවර්තක	9,754	35,044	27,127	17,671
ගිනි අවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා	315	557	301	571
පුපුරණ ද්‍රව්‍ය හා ගිනි ගැනීම්	125	608	381	352
අධිකරණ ධූලක විද්‍යා (වස වර්ග)	1,139	2,903	1,819	2,223
අධිකරණ මස්තු විද්‍යා	3,221	2,172	1,393	4,000
සැක කටයුතු ලේඛණ	172	812	726	258
ඩිජිටල් අපරාධ	1,157	1,143	833	1,467
විවිධ අධිකරණ ද්‍රව්‍ය	354	933	866	421
මත්පැන්	1,453	11,599	9,824	3,228
මධ්‍යසාර හා දුම්කොළ	92	3,210	3,302	-
ආහාර පනත යටතේ ආහාර සාම්පල	30	4,016	4,024	22
විවිධ ආහාර වර්ග	10	1,527	1,530	7
එකතුව	**17,822**	**64,524**	**52,126**	**30,220**

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2024 වර්ෂය තුළ ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වැඩමුළුව, සම්මන්ත්‍රණය අන්තර්ජාලය ඔස්සේ පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන	සැසිවාර ගණන	සහභාගී වූ ගණන
28	67	1,394

අධිකරණ නොවන නිලධාරීන් පුහුණු ආයතනයේ 2024.01.01 සිට 2024.12.31 දක්වා පවත්වන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වැඩසටහන	සංඛ්‍යාව	පුහුණුලාභීන් සංඛ්‍යාව
පුහුණු වැඩසටහන්	47	1,713
කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ	08	135
බඳවා ගැනීම් තරඟ විභාග	01	126
එකතුව	**56**	**1,974**

2.1.4. නීතියට සම ප්‍රවේශය සහතික කිරීම

නීති ආධාර කොමිෂන් සභාවේ 2024 වර්ෂයේ සපයා ඇති සේවය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

නඩු පිළිබඳ විස්තරය	**නඩු ප්‍රමාණය**
2024.01.01 දිනට ඉදිරියට ගෙන එන ලද නඩු සංඛ්‍යාව	**38,905**
2024 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා අළුතින් ගොනු කරන ලද නඩු සංඛ්‍යාව	**12,362**
2024 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට පැවති මුළු නඩු ගණන	**51,267**
2024 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා අවසන් කරනු ලැබූ නඩු සංඛ්‍යාව	**23,709**
2025 වර්ෂයේ ජනවාරි 01 වන දිනට රැගෙන ගිය නඩු සංඛ්‍යාව	**27,558**
2024 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා දෙනු ලැබූ මුළු උපදේශන සංඛ්‍යාව	**127,028**
2024 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා සිදු කරනු ලැබූ සමස්ථ සේවය	**51,267+127,028 =178,295**

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2024 වර්ෂයේ ප්‍රගතිය පහත පරිදි වේ.

	පැමිණිලි ඉල්ලීම් /	2024 වර්ෂය
I.	හිමිකම් හා අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සම්බන්ධ	68
II.	වැරදි විමර්ශනය සඳහා	101
III.	සහාය ලබා ගැනීම සඳහා ඉල්ලීම්	83
	අදාළ කාලය තුළ ලද සමස්ථ පැමිණිලි	**252**

i. හිමිකම් සහ අයිතිවාසිකම් උල්ලංඝනය වීම්

2024 වර්ෂයේ තුළ දැනට ලැබී ඇති පැමිණිලි ගණන	171
2024 වර්ෂයේ තුළ දැනට ලැබී ඇති පැමිණිලි ගණන	68
එකතුව	**239**
විමර්ශන අවසන් කරන ලද පැමිණිලි ගණන (2024-01-01 සිට 2024-12-31 දක්වා)	62
තවදුරටත් විමර්ශනය වෙමින් පවතින පැමිණිලි ගණන	177

ii. වැරදි විමර්ශනය

2024 වර්ෂයේ තුළ දැනට ලැබී ඇති පැමිණිලි ගණන	178
2024 වර්ෂයේ තුළ දැනට ලැබී ඇති පැමිණිලි ගණන	101
එකතුව	**279**
අවසන් කරන ලද පැමිණිලි ගණන (2024-01-01 සිට 2024-12-31 දක්වා)	64
වරද විමර්ශනය කරන ලෙස පොලිස් කොට්ඨාසය හා පොලිස් ස්ථාන වෙත යොමු කර ඇති පැමිණිලි ගණන	215

iii. සහාය ලබා ගැනීම සඳහා වන ඉල්ලීම්

2023 වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද පැමිණිලි ගණන	89
2024 වර්ෂයේ තුළ දැනට ලැබී ඇති පැමිණිලි ගණන	83
එකතුව	**172**
සහය ලබා දී අවසන් කරන ලද පැමිණිලි ගණන (2024-01-01 සිට 2024-12-31 දක්වා)	42
VIS ගොනු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කර ඇති පැමිණිලි ගණන	40
සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක මඟින් සාක්ෂි ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කර ඇති පැමිණිලි ගණන	61
තවදුරටත් සහය ලබා දෙමින් පවතින පැමිණිලි ගණන	29

ආරක්ෂාව ලබා ගැනීම සඳහා වන ඉල්ලීම්

පෙර වර්ෂ වලින් ඉදිරියට ගෙන එන ලද පැමිණිලි ගණන	382
වර්ෂය තුළ ලැබී ඇති පැමිණිලි ගණන 2024	196
එකතුව	**578**
අවසන් කරන ලද පැමිණිලි ගණන 2024.01.01 සිට 2024.09.30 දක්වා	96
විමර්ශනය වෙමින් පවතින සහ අන්තර් ආරක්ෂාවක් ලබා දෙමින් පවතින ඉල්ලීම්	337
ආරක්ෂාව ලබා දෙමින් පවතින සහ ආරක්ෂාව ලබා දෙන ලද ඉල්ලීම්	145

2.1.5. විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම

ප්‍රජා සමථ මූල මණ්ඩලවල 2024 වර්ෂයේ කාර්යසාධනය පහත පරිදි වේ.

විස්තරය	ආරවුල් සංඛ්‍යාව
2024 වර්ෂය ආරම්භයේ විසඳීමට ඉතිරි වූ ආරවුල් සංඛ්‍යාව	42,521
2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා ලද ආරවුල් සංඛ්‍යාව	203,170
මුළු එකතුව	**245,691**
සාකච්ඡා කර නිරවුල් කල ආරවුල් සංඛ්‍යාව	67,044
සාකච්ඡා කර නිරවුල් නොවූ ආරවුල් සංඛ්‍යාව	30,036
සාකච්ඡා කළ මුළු ආරවුල් සංඛ්‍යාව	97,080
නිරවුල් කිරීමේ ප්‍රතිශතය	**69.1%**
නොපැමිණීම හේතුවෙන් නිරවුල් නොවූ ආරවුල් සංඛ්‍යාව	91,083
ප්‍රතික්ෂේප කිරීම	3,416
ඉල්ලා අස්කර ගැනීම	8,627
කටයුතු අවසන් කළ මුළු ආරවුල් සංඛ්‍යාව	**200,206**
ඉදිරියට ගෙන ගිය ආරවුල් සංඛ්‍යාව	45,485

දිස්ත්‍රික්ක 16ක පිහිටුවා ඇති විශේෂ ඉඩම් සමථ මණ්ඩලවලට අදාළ ආරවුල් විසඳීමේ තොරතුරු පහත පරිදි වේ.

විස්තරය	ආරවුල් සංඛ්‍යාව	
2024 වර්ෂය ආරම්භයේ විසඳීමට ඉතිරි වූ ආරවුල් සංඛ්‍යාව	1,909	
2024.01.01 සිට 2024.12.31 දක්වා ලද ආරවුල් සංඛ්‍යාව	1,789	
මුළු එකතුව		**3,698**
සාකච්ඡා කර නිරවුල් කල ආරවුල් සංඛ්‍යාව	535	
සාකච්ඡා කර නිරවුල් නොවූ ආරවුල් සංඛ්‍යාව	680	
සාකච්ඡා කළ මුළු ආරවුල් සංඛ්‍යාව		**1,215**
නිරවුල් කිරීමේ ප්‍රතිශතය	44.03%	
නොපැමිනීම හේතුවෙන් නිරවුල් නොවූ ආරවුල් සංඛ්‍යාව	1,455	
ප්‍රතික්ෂේප කිරීම්	160	
ඉල්ලා අස්කර ගැනීම්	104	
කටයුතු අවසන් කල මුළු ආරවුල් සංඛ්‍යාව		**2,934**
ඉදිරියට ගෙන ගිය ආරවුල් සංඛ්‍යාව		**764**

ණයසහනදායී මණ්ඩලීය දෙපාර්තමේන්තුව වෙත 2024 වර්ෂයේ ලැබුණු ආරවුල් විසඳීම පිළිබඳව විස්තර පහත පරිදි වේ.

විස්තරය	සංඛ්‍යාව
2024.01.01 වන දිනට ඉදිරියට ගෙනා නොනිමි අයදුම්පත් සංඛ්‍යාව	1,157
නව ඉල්ලුම්පත් සංඛ්‍යාව	642
ශාඛාවලින් ලද අයදුම්පත් සංඛ්‍යාව	12
සමාලෝචනය කිරිම සඳහා කරන ලද ඉල්ලීම්	121
නිශ්ප්‍රභා කරන ලද නඩු නැවත කැඳවන ලෙස කරන ලද ඉල්ලීම්	126
මුළු අයදුම්පත් සංඛ්‍යාව	**2,058**
සමථයට පත් කළ අයදුම්පත් සංඛ්‍යාව	313
සමාලෝචනය කළ අයදුම්පත් සංඛ්‍යාව	86
නිශ්ප්‍රභා කළ අයදුම්පත් සංඛ්‍යාව	170
ශාඛා වෙත යවන ලද අයදුම්පත් සංඛ්‍යාව	13
පසෙක තබන ලද අයදුම්පත් සංඛ්‍යාව	31
සහතික නිකුත් කළ අයදුම්පත් සංඛ්‍යාව	59
රෝලෙන් ඉවත් කළ අයදුම්පත් සංඛ්‍යාව	97
ඉල්ලා අස්කර ගත් අයදුම්පත් සංඛ්‍යාව	91
නියෝග අනුව නඩු කටයුතු අවසන් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව	453
පියවර ගත් මුළු අයදුම්පත් සංඛ්‍යාව	**1,313**
ඉතිරි වී ඇති අයදුම්පත් සංඛ්‍යාව	745
සමථ වූ නමුත් නැවත කැඳවූ නඩු	214
2024.12.31 දිනට අවසන් නොවී ඉතිරි වූ අයදුම්පත් සංඛ්‍යාව	**959**

2.1.6 ජාතික ඒකාබද්ධතාවය සහ සංහිදියාව තහවුරු කිරීම.

2024 වර්ෂයේ ජාතික ඒකාබද්ධතා අංශය විසින් ක්‍රියාත්මක කල වැඩසටහන්වල ප්‍රගතිය පහත පරිදි වේ.

විස්තරය	වියදම (රු.මි)
සහජීවන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	15.43
සංහිදියාව අරමුණු කර ගත් ආර්ථික සවිබලගැන්වීම හා සමාජ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය	16.96
දිස්ත්‍රික් මට්ටමින් ප්‍රතිසන්ධාන කමිටු පිහිටුවීම.	1.06
ප්‍රතිසන්ධානය ශක්තිමත් කිරීම අරමුණු කර ගත් ආර්ථික සවි බලගැන්වීම හා සමාජ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (උතුරු හා නැගෙනහිර පළාත්)	14.59
එකතුව	48.04

ජාතික සමඟිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලයේ 2024 වර්ෂයේ ප්‍රගතිය පහත පරිදි දැක්වේ.

i) <u>කලා හා සංස්කෘතික අංශය</u>

ක්‍රියාකාරකම්	ඉලක්ක කණ්ඩායම්	මූල්‍ය ප්‍රගතිය (රු. මි)	භෞතික ප්‍රගතිය
1.1 ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමඟ ප්‍රාදේශීය මට්ටමේ ප්‍රතිසන්ධාන වැඩසටහන	දිවයිනටම	7.4	100%
1.2 වෙනත් කලා හා සංස්කෘතිය ආශ්‍රිත ව්‍යාපෘති	උතුරු, මධ්‍යම, දකුණ සහ බස්නාහිර පලාත්	3	100%

ii) <u>අධ්‍යාපන හා ගැටුම් විපරිවර්තන අංශය</u>

ක්‍රියාකාරකම්	ඉලක්ක කණ්ඩායම්	වැඩසටහන්/ සහභාගීත්වය	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	භෞතික ප්‍රගතිය
ත්‍රෛ භාෂා පුස්තකාල වැඩසටහන	ග්‍රාමීය ජනතාව	ග්‍රාමීය ජනතාව	5.00	50%
ද්වීභාෂා වැඩසටහන (සිංහල-දෙමළ)	රාජ්‍ය නිලධාරීන් / පෞද්ගලික අංශ / පෙරපාසල් ගුරුවරුන් /තරුණ තරුණියන්	වැඩසටහන් -100 සහභාගීත්ව - 5000	16.00	100%
විශ්ව විද්‍යාල වැඩසටහන්	විශ්ව විද්‍යාල සිසුන්	වැඩසටහන් -2 සහභාගීත්ව - 300	0.53	20%
දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම්	දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ඒකාබද්ධතා නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්	වැඩසටහන් -23 සහභාගීත්ව - 1,600	0.99	31%
එක්දින වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින්	කාන්තාවන් /තරුණ තරුණියන් / ආගමික නායකයින් / සිවිල් සමාජ නායකයින්, රාජ්‍ය නිලධාරීන්	වැඩසටහන් -1,500 සහභාගීත්ව- 68,000	-	100%
ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ සහජීවන සංගම් පිහිටුවීම	කාන්තාවන් / තරුණ තරුණියන් / ආගමික නායකයින් / සිවිල් සමාජ නායකයින්, රාජ්‍ය නිලධාරීන්	වැඩසටහන් -1,019 සහභාගීත්ව - 35,700	**1.00**	41%

ගැටුම් විපරිවර්තනය සඳහා පෙර දැනුම් දීමේ පද්ධතියක් නිර්මාණය කිරීම	කාන්තාවන්/තරුණ තරුණියන්/ආගමික නායකයින්/ සිවිල් සමාජ නායකයින්, රාජ්‍ය නිලධාරින්, රාජ්‍ය ආයතන	-	මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමිවීම ප්‍රමාද වීම නිසා මෙම වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර මූලික මට්ටමේ වැඩ සිදුකර ඇත.

iii) ආර්ථිකයට යොමුකරවීමේ වැඩසටහන

ක්‍රියාකාරකම්	ඉලක්ක කණ්ඩායම්	වැඩසටහන්/ සහභාගීත්වය	මූල්‍ය ප්‍රගතිය (රු.මී.)	භෞතික ප්‍රගතිය
ආන්තීකරණයට ලක්වූ ජනතාවගේ මූලික පහසුකම් සංවර්ධනය.	ගැටුම් සහ අනෙකුත් කරුණු හේතුවෙන් පීඩාවට පත් ජනතාව	10 / ළමුන් 1400	**12.75**	100%
ආන්තීකරණයට ලක්වූ ජනතාව මූලික කරගත් ජීවනෝපාය වැඩසටහන	ගැටුම් සහ අනෙකුත් කරුණු හේතුවෙන් පීඩාවට පත් ජනතාව	1/ගොවි පවුල් 120	**3.00**	45%
රටේ අවදානමට ලක් විය හැකි ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම පිළිබඳ මහජන අදහස් විමසීම.	රටේ අවදානමට ලක්විය හැකි ප්‍රජාව	-	**-**	-

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ 2024 වර්ෂයේ විමර්ශන පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ ලැබී ඇති පැමිණිලි සහ ගෙන ඇති ක්‍රියාමාර්ග

සම්පූර්ණ පැමිණිලි සංඛ්‍යාව	1990 ට පෙර අතුරුදහන් වීම (තුන්වන අදියර)	1991-1999 අතර අතුරුදහන් වීම (දෙවන අදියර)	2000ට පසු අතුරුදහන් වීම (පළමු අදියර)	විමර්ශන සිදුකළ පැමිණිලි සංඛ්‍යාව (2024.12.31)
14,988	5,366	3,597	6,025	6,448

හානිපූර්ණය සඳහා වන කාර්යාලය 2024 වර්ෂයේ වන්දි ගෙවීමට අදාළ තොරතුරු පහත පරිදි වේ.

ප්‍රධාන යෝජනා ක්‍රම	උප ප්‍රධාන ක්‍රම	ප්‍රතිලාභීන්	ගෙවන ලද ප්‍රමාණය (රුපියල්)
උතුරු නැගෙනහිර අර්බුදය	අතුරුදහන්වූවන්	3,448	689,600,000
	දේපල හා මරණ	7,506	938,162,230
	උප එකතුව	**10,954**	**1,627,762,230**
සිවිල් කලබල (නිශ්චල දේපල)	2022 මැයි	168	308,070,717
සිවිල් කලබල (චංචල දේපල)	2022 මැයි	76	64,992,411
දේශපාලන පළිගැනීමවලට ලක්වූවන්		73	32,197,986
පාස්කු ඉරිදා ප්‍රහාරය (තුවාල)		1	50,000
	එකතුව	**11,272**	**2,033,073,344**

2.1.7. බන්ධනාගාර පරිපාලනය හා පුනරුත්ථාපනය

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2024 වසර තුල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය 2024.01.01-2024.12.31

ව්‍යාපෘතිය	මුළු ඝිරිවැය ඇස්තමේන්තුව (TEC) (රු.මි.)	2023.12.31 දිනට සම්පූර්ණ කියදම (රු.මි.)	2024 ට වෙන් කළ ප්‍රතිපාදන (රු.මි)	2024.12.31 දිනා දක්වා කියදම (රු.මි)	භෞතික ප්‍රගතිය
නව දුම්බර බන්ධනාගාරය ඉදිකිරීම (කොන්ත්‍රාත් අංක - 11)	734.3	2,325.4	250.00	209.66	95.9%
මහර බන්ධනාගාරයේ ගොඩනැගිලි ඉදිකිරීම	42.9	-	65.00	17.68	වැඩ ආරම්භ කර ඇත.
වවුනියා බන්ධනාගාරයේ Barrack ඉදිකිරීම	9.9	-	10.00	4.14	වැඩ ආරම්භ කර ඇත.
පල්ලන්සේන නිරෝධායන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ගොඩනැගිලි අඛණ්ඩව පවත්වාගෙන යාම	135.00	104.14	10.00	5.50	98.5%
SPEAT Force නිලධාරීන් සඳහා පෙර සවි ගොඩනැගිලි ආකාරයට Barrack ඉදිකිරීම	8.29	2.83	7.5	6.82	100%
වාරියපොල බන්ධනාගාරයේ මුර අට්ටාල ඉදිකිරීම	9.9	-	10.00	-	කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත.
ගම්පොළ සිර මැදිරිය ඉදිකිරීම	8.28	-	9.3	7.57	අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදීගෙන ඇත.
කෑගල්ල බන්ධනාගාරයේ නාය යෑම් කොටස ස්ථායීකරණ රැඳවුම් පවුර ඉදිකිරීම සඳහා උපදේශණ ගාස්තු	19.88	22.89	0.2	0.19	100%

ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව විසින් විශෝධන ආඥා ක්‍රියාත්මක කිරීමට අදාළ තොරතුරු පහත පරිදි වේ.

2024 වර්ෂයේ විශෝධන ආඥා පිළිබඳ තොරතුරු

වර්ෂය	ලබා ගත් ආඥා සංඛ්‍යාව	අවසන් කරන ලද ආඥා සංඛ්‍යාව	කඩ කිරීම් සංඛ්‍යාව
2024	15,631	6,536	2,111
පසුගිය වර්ෂවල නියෝග ලැබී නමුත් එම වර්ෂ වල දී නියෝග සම්පූර්ණ නොකරන ලද 2024 වර්ෂයේ කටයුතු කරන නියෝග පිළිබඳව විස්තර	8,061	4,630	2,002
එකතුව	**23,692**	**11,166**	**4,113**

පුනරුත්ථාපන කාර්යාංශය විසින් 2024 වර්ෂයේ ඉටුකළ පුනරුත්ථාපන කටයුතු පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

2024.01.01 දින සිට 2024.12.31 දක්වා පුනරුත්ථාපනය සඳහා යොමු කළ සංඛ්‍යාව සහ සමාජගත කල සංඛ්‍යාව

මාසය	පුනරුත්ථාපනයට යොමු කළ සංඛ්‍යාව	සමාජගත කළ සංඛ්‍යාව
ජනවාරි	110	76
පෙබරවාරි	23	212
මාර්තු	67	96
අප්‍රේල්	55	56
මැයි	48	46
ජුනි	64	102
ජුලි	44	26
අගෝස්තු	29	27
සැප්තැම්බර්	35	58
ඔක්තෝම්බර්	45	44
නොවැම්බර්	65	35
දෙසැම්බර්	57	42
එකතුව	**642**	**820**

2.2 අභියෝග හා ඉදිරි ඉලක්ක

අධිකරණ අමාත්‍යාංශයට අදාල ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රධාන අභියෝග වන්නේ

- අධිකරණ වල පවතින විසඳීම ප්‍රමාද වී ඇති නඩු සංඛ්‍යාව
- ආයතනවල කාර්යසාධනයට බාධාවන මානව සම්පත් හි උග්‍ර හිඟය
- අධිකරණ අමාත්‍යාංශය හා එයට අයත් දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන ගණනාවක් කුලී ගොඩනැගිලිවල පවත්වාගෙන යාම
- බන්ධනාගාර තුළ රැඳවියන්ගේ තදබදය.

මෙම අභියෝග ජයගැනීම සඳහා කෙටි කාලීන සහ දිගු කාලීන වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර 2025 වර්ෂයේ සැලසුම් පහත පරිදි වේ.

2.2.1 නීති ප්‍රතිසංස්කරණය

2025 වර්ෂයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇති පනත්

පනතේ නම	අරමුණ
01.2018 අංක 19 දරන ජාතික විගණන (සංශෝධන) පනත	විගණන පනතේ සංශෝධන සඳහා
02.ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත	ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය ඉහල නැංවීම සහ ආරක්ෂා කිරීම, සහතික කිරීම වෙනුවෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික කවුන්සලයක් ස්ථාපිත කිරීම. ශ්‍රී ලංකාවේ ආබාධිත

	පුද්ගලයින් සම්බන්ධ නීතිය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල කිරීම.
03.මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත	චර්යා ධර්ම පද්ධතියක් ප්‍රකාශයට පත් කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවට බලය ලබා දීමට ද, එය උල්ලංඝනය කරන්නන්ට එරෙහිව නෛතික ක්‍රියා මාර්ග ගැනීමට නීති සකස් කිරීම.
04.අපරාධ සිදුකිරීම තුලින් උපයන වත්කම් යලි ලබාගැනීම සහ රාජසන්තක කිරීම සඳහා වූ පනත් කෙටුම්පත	අපරාධ සිදුකිරීම තුලින් උපයන වත්කම් යලි ලබාගැනීම සහ රාජසන්තක කිරීම සඳහා ප්‍රතිපාදන සැලැස්වීම.
05.බේරාගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත	බුන්වත්භාවය සම්බන්ධයෙන් නීති පැනවීම.
06.අපරාධ නඩුවිධාන සංග්‍රහය සඳහා සංශෝධන (167 වන වගන්තිය - ශ්‍රව්‍ය හා දෘෂ්‍ය මාධ්‍ය හරහා දේශීය සහ විදේශීය සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සටහන් කිරීම)	සාක්ෂිකරුවකුගේ සාක්ෂි විවෘත අධිකරණයේදී ශ්‍රව්‍ය හා දෘෂ්‍ය මාධ්‍ය හරහා දේශීය සහ විදේශීය සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සටහන් කිරීමට නව විධිවිධාන ඇතුළත් කිරීම.
07.සිවිල් නඩුවිධාන සංග්‍රහය සඳහා සංශෝධන (167 වන වගන්තිය - ශ්‍රව්‍ය හා දෘෂ්‍ය මාධ්‍ය හරහා දේශීය සහ විදේශීය සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සටහන් කිරීම)	සාක්ෂිකරුවකුගේ සාක්ෂි විවෘත අධිකරණයේදී ශ්‍රව්‍ය හා දෘෂ්‍ය මාධ්‍ය හරහා දේශීය සහ විදේශීය සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සටහන් කිරීමට නව විධිවිධාන ඇතුළත් කිරීම.
08. 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම	2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනතේ IX කොටසේ 74 (1) වගන්තිය ප්‍රකාරව වින්දිතයන් සඳහා වන්දි සහ තාවකාලික ප්‍රදානයන් සිදුකිරීමට උපදේශක මණ්ඩලයක් පත්කිරීමට ප්‍රතිපාදන සැලසීම
09.සමථ මණ්ඩල (සිවිල් සහ වාණිජ ආරවුල් නිරාකරණය) පනත	ස්වේච්ඡා සමථකරණයන් සඳහා ව්‍යවස්ථාපිත රාමුවක් හඳුන්වා දීම සහ 2000 අංක 44 දරණ ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනත අවලංගු කිරීම.
10.අධිකරණ මගින් නඩු භාණ්ඩ කළමනාකරණය කිරීම සහ බැහැර කිරීම සඳහා නව පනතක් හඳුන්වාදීම	පළමු අවස්ථාවේදීම යෝජිත නඩු විභාගයේදී භෞතික සාක්ෂි ලෙස ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන නඩු භාණ්ඩ අයිතම හැර, හැකි ඉක්මනින් අධිකරණ භාරයේ ඇති අනෙකුත් සියලුම අයිතම බැහැර කිරීම හෝ විනාශ කිරීමට අවශ්‍ය පියවර සඳහන් කිරීම.
11.භාර ආඥා පනතට සංශෝධන	1917 දී බලාත්මක කරන ලද භාර ආඥා පනත මඟින් භාර සම්බන්ධ නීතිය නිර්වචනය සහ සංශෝධනය කිරීම
12.නව බේරුම්කරණ පනත.	දැනට පවතින බේරුම්කිරීමේ පනත අවලංගු කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම එමගින් වඩා කාර්යක්ෂම හා ප්‍රතිඵලදායක බේරුම්කරණ ක්‍රියාවලියක් ඇති කිරීම
13.2007 අංක 54 දරණ ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය) පිළිබඳ පනත සංශෝධනය	මත්ද්‍රව්‍ය මත යැපෙන පුද්ගලයින්ට කාර්යක්ෂම ප්‍රතිකාර සහ අර්ථවත් පුනරුත්ථාපනය කිරීම සඳහා පවතින ප්‍රතිපාදන වැඩි දියුණු කිරීම.

14.මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් මහ මුහුදේ දී අත්අඩංගුවට ගත් විදේශිකයන්ට නඩු පැවරීමට අදාළ පනත් කෙටුම්පත	මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් මහ මුහුදේ දී අත්අඩංගුවට ගත් විදේශිකයන්ට නඩු පැවරීමට අදාළ නීති සකස් කිරීම
15.2013 අංක 02 දරණ අපරාධ නඩු විධි විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 (2) වගන්තිය යටතේ නියෝග	විමර්ශන පැවැත්වීම පහසු කිරීම සඳහා ඇතැම් නඩු වලදී ලඝු නොවන පරීක්ෂණ පැවැත්වීම බැහැර කිරීම, පැමිණිල්ලේ දිවුරුම් සාක්ෂි ලබා ගැනීම ආදියට විධිවිධාන සැලසීම සඳහා වූ පනතේ කාල සීමාව තවත් වසර 02 කින් දීර්ඝ කිරීම සඳහා වේ.

2.2.2 යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

මෙම වසර සඳහා අයවැය ඇස්තමේන්තුව මඟින් වෙන්ව පවතින ප්‍රතිපාදන භාවිතයෙන් මේ වන විට ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලබන ව්‍යාපෘති කඩිනමින් අවසන් කිරීමටත්, ආර්ථික අර්බුදය හමුවේ තාවකාලිකව නවතා දැමූ ව්‍යාපෘති යළි ආරම්භ කිරීමටත් ප්‍රමුඛතාවය ලබා දී ඇත.

මහජන චීන සමූහාණ්ඩුවේ ප්‍රදානයක් ලෙස උපරිමාධිකරණ සංකීර්ණය නවීකරණය කිරීම ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස අමාත්‍යාංශය නවීකරණය කර අභියාචනාධිකරණය වෙත පවරා ඇත. එහි දෙවන අදියර ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය පිහිටි ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. එම ඉදිකිරීම් මෙම වසරේදී අවසන් කිරීමට නියමිතව පවතී. ව්‍යාපෘතියට අදාල මුළු වියදම් ඇස්තමේන්තුව යුවාන් මිලියන 230කි.

අධිකරණ අමාත්‍යාංශය දැනට කුලී ගොඩනැගිල්ලක පවත්වා ගෙන යනු ලැබේ. ඒ වෙනුවට අධිකරණ පියස ව්‍යාපෘතියට පවරා ගත් ඉඩම් කොටස අමාත්‍යාංශයට අයත් අනෙකුත් ආයතන සඳහා මහල් 15කින් යුතු ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මූලික කටයුතු සිදුකර ඇත. එහි පළමු අදියර ලෙස 2025 වසරේදී මහල් 10ක වැඩකටයුතු ආරම්භ කර ඇත.

උක්ත ව්‍යාපෘති ඇතුලත්ව 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් පහත පරිදි වේ.

	ව්‍යාපෘතිය	**ඇස්තමේන්තුව (රු. මි)**
01	උපරිමාධිකරණ සංකීර්ණයේ විස්තීරණ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය	10,000
02	අධිකරණ අමාත්‍යාංශ නව ගොඩනැගිල්ල ඉදිකිරීම	9,550
03	මහේස්ත්‍රාත් අධිකරණ සංකීර්ණය ඉදිකිරීම, කොළඹ 12	8,000
04	මාතලේ අධිකරණ සංකීර්ණය ඉදිකිරීම	600
05	ගාල්ල අධිකරණ සංකීර්ණය ඉදිකිරීම - අදියර II	1,600
06	පූගොඩ අධිකරණ සංකීර්ණය ඉදිකිරීම	850
07	කන්තලේ අධිකරණ සංකීර්ණය ඉදිකිරීම	300
08	අලුත්කඩේ අධිකරණ සංකීර්ණය අලුත්වැඩියා කිරීම	1,320
09	වලපනේ අධිකරණ සංකීර්ණය ඉදිකිරීම - ඉතුරු වැඩ	850
10	වාකරේ නව අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම	50
11	පුත්තලම පෙරනිමි අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම	240
12	සමන්තුරේ පෙරනිමි අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම	70
13	මනම්පිටිය පෙරනිමි අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම	75
14	කුච්චවේලි පෙරනිමි අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම	120

15	වාලච්චේන පෙරනිමි අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම	330
16	නිකවැරටිය පෙරනිමි අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම	170
17	හෙල්බොඩ අධිකරණයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම- ඉතුරු වැඩ	80*
18	මහව දිසා මහෙස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම - ඉතුරු වැඩ	150*
19	දඹුල්ල අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම - ඉතුරු වැඩ	100*
20	වැල්ලවාය නව අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම - ඉතුරු වැඩ	120*
21	බණ්ඩාරවෙල දිසා අධිකරණ නව ගොඩනැගිල්ල ඉදිකිරීම - ඉතුරු වැඩ	100*
22	මොණරාගල නව අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම - ඉතුරු වැඩ	200*
23	හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ගොඩනැගිල්ල ඉදිකිරීම - ඉතුරු වැඩ	150*
24	කැකිරාව නව අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම - ඉතුරු වැඩ	120*
25	කලවාන අධිකරණයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම - ඉතුරු වැඩ	100*
26	දෙහිඅත්තකණ්ඩිය දිසා අධිකරණය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම - ඉතුරු වැඩ	200*
27	ඇඹිලිපිටිය ද්විත්ව විනිසුරු නිල නිවස ඉදි කිරීම - ඉතුරු වැඩ	50
28	පානදුර ද්විත්ව විනිසුරු නිල නිවස ඉදි කිරීම - ඉතුරු වැඩ	80*
29	මොරවක අධිකරණයේ රැඳවුම් බැම්ම ස්ථාවර කිරීම	150*
30	මීගමුව අධිකරණ සංකීර්ණයේ වහලය අළුත්වැඩියා කිරීම	50*

* ඉතිරි වැඩ සඳහා ඇස්තමේන්තු සකස් කරමින් පවතින ව්‍යාපෘති බැවින් වටිනාකම ආසන්න අගයකි.

මීට අමතරව උපදේශක සේවා ව්‍යාපෘති ලෙස නව අධිකරණ ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘති 17ක්, පැවති ආර්ථික සීමාවන් හේතුවෙන් සැලසුම් අදියරවලදීම තාවකාලිකව නවතා දමා ඇත. මෙම ව්‍යාපෘතිවලින් ප්‍රමුඛතාවය අනුව කඩුවෙල සහ අවිස්සාවේල්ල ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු 2026 වසරේ ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

2.2.3 මානව සම්පත් සංවර්ධනය

අධිකරණ වල සහ අධිකරණ අමාත්‍යාංශයට අයත් සියළුම දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන වල මෙන්ම අමාත්‍යාංශයේද, පවතින සම්පූර්ණ කාර්යය මණ්ඩල හිඟය මේ වන විට 6,026ක් වීම සැමට අප්‍රමාදව යුක්තිය ඉටුකිරීමේ ක්‍රියාවලියේදී ප්‍රධාන අභියෝගයක් බවට පත්ව තිබේ. රාජ්‍ය සේවකයින් බඳවා ගැනීම් සමාලෝචන කමිටුවට මෙම අවශ්‍යතා ඉදිරිපත් කර ඇති අතර, ඔවුන්ගේ තීරණය ලද පසු, මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට සැලසුම්කර ඇත.

2.2.4 අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීම

අධිකරණ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා ඩිජිටල්කරණය කිරීම මූලික අවශ්‍යතාවක් ලෙස අධ්‍යයන රැසකින්ම හඳුනාගෙන ඇත. නවීන තාක්ෂණයෙන් පිරිපුන්, අධිකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් "Rapid Digital Strategy" ව්‍යාපෘතිය ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සමඟ එක්ව ක්‍රියාත්මක කිරීම සඳහා ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු අර්ජුන ඔබේසේකර මහතාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත්කර ඇත. ආරම්භයේදී නියමු ව්‍යාපෘතියක් ලෙසට මහනුවර සහ මීගමුව අධිකරණ සංකීර්ණ ඩිජිටල්කරණය කිරීම සඳහා තෝරාගෙන ඇති අතර 2025 වසරේදී ආරම්භ කිරීමට සැලසුම්කර ඇත.

2.2.5 බන්ධනාගාර තදබදය ඉවත් කිරීම

රැඳවියන් 10,395ක් රැඳවිය හැකි බන්ධනාගාරවල වර්තමානයේ 30,000කට ආසන්න ප්‍රමාණයක් සිටී. මෙම බන්ධනාගාර තදබදය රජයට විශාල පිරිවැයක් මෙන්ම රැඳවියන්ටද ඉතාමත් අපහසු තත්ත්වයක්

වී ඇත. ඒ අනුව බන්ධනාගාර තදබදය ඉවත් කිරීමට සහ මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනයට සුදුසු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීමට කමිටුවක් පත් කර ඇත. එම කමිටුවේ නිර්දේශ අනුව බන්ධනාගාර තදබදය ඉවත් කිරීමට සැලසුම්කර ඇත.

2.2.6 විකල්ප ආරවුල් විසඳීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම

අධිකරණයේ ගොඩගැසී ඇති නඩු ප්‍රමාණය අඩු කිරීමට විකල්ප ආරවුල් විසඳීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම රුකුළක් වේ. සමථ මණ්ඩල වෙත වර්ෂයකට, ආරවුල් ලක්ෂ දෙකකට වැඩි ප්‍රමාණයක් වාර්තා වේ. ඒ අනුව තවදුරටත් සමථ මණ්ඩල ශක්තිමත් කර දැනට දිස්ත්‍රික්ක 16ක පිහිටා ඇති ඉඩම් ආරවුල් පිළිබඳ විශේෂ සමථ මණ්ඩල ඉතිරි දිස්ත්‍රික්ක 09 හිත් පිහිටුවීමට සැලසුම්කර ඇත. එසේම අධිකරණයට යොමුවන මූල්‍ය ආරවුල් ප්‍රමාණය අඩු කිරීම සඳහා මූල්‍ය ආරවුල් පිළිබඳ විශේෂ සමථ මණ්ඩල ස්ථාපිත කිරීමට නියමිතය. පළමු අදියර විදිහට කොළඹ, ගම්පහ, අනුරාධපුර, පොළොන්නරුව, මහනුවර, මොණරාගල යන දිස්ත්‍රික්ක 6හි විශේෂ මූල්‍ය ආරවුල් පිළිබඳ සමථ මණඩල පිහිටුවීමට සැලසුම්කර ඇත.

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව මගින් ගේදොර, වතුපිටි හෝ ගොඩ මඩ කෘෂිකාර්මික ඉඩම් උකසට තබා හෝ පොරොන්දු සින්නක්කරයක් හෝ සින්නක්කරයක් මත ගන්නා ණය මුදලක් ආපසු ගෙවීම සම්බන්ධයෙන් ඇතිවන ගැටළුවක දී නීතිමය සහනයක් සලසන ආයතනයක් ලෙස මැදිහත් වේ. මෙහි ප්‍රධාන මණ්ඩලයට අමතරව කොළඹ, කුරුණෑගල, ගම්පහ, ගාල්ල යන දිස්ත්‍රික්කයන් හි ශාඛා මණ්ඩල පිහිටුවා ඇත. ඊලහ ශාඛාව මහනුවර ස්ථාපිත කිරීමට සැලසුම්කර ඇත.

2.2.7 නීතියට සම ප්‍රවේශය සහතික කිරීම

ප්‍රාදේශීය නීති ආධාර මණ්ඩල 85ක් යටතේ ක්‍රියාත්මක වන නීති ආධාර කොමිෂන් සභාවේ සේවය තවදුරටත් ශක්තිමත් කිරීමට සැලසුම්කර ඇත. බිබිල, කයිට්ස්, ආණමඩුව, වලපනේ, ගම්පොල සහ රුවන්වැල්ල සඳහා නව නීති ආධාර මධ්‍යස්ථාන විවෘත කිරීමට සැලසුම්කර ඇත.

2.2.8 ජාතික ඒකාබද්ධතාව සහ සංහිදියාව සුරක්ෂිත කිරීම

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, ජාතික සමගිය, ජාතික ප්‍රතිසංධානය, ජාතික ඒකාබද්ධතාවය අරමුණුකරගත්, සෑම ජන කොටසකටම ගරු කරන, නිදහස් හා සමානාත්මතාවය අගයන සමාජයක් බිහිකිරීම වෙනුවෙන් වැඩසටහන් ගණනාවක් 2025 වසරේ සංවිධානය කර ඇත.

ඒ අනුව අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය සහ අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තු සහ ආයතන විසින් විශාල කාර්යභාරයක් ඉදිරියේදී සිදුකිරීමට සැලසුම්කර ඇත. එම කටයුතු සාර්ථක කර ගැනීමට නායකත්වය සහ මහපෙන්වීම සිදුකරන ගරු අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍ය නීතීඥ හර්ෂණ නානායක්කාර මැතිතුමාවත් එතුමාට සහයෝගය ලබාදෙන ගරු ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍ය එම්.එම්.එම්.මුනීර් මුලෆර් මැතිතුමාවත් කෘතවේදීව සිහිපත් කරමි. එසේම ඉතාමත් කැපවීමෙන් කටයුතු කරන අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ කාර්යමණ්ඩලයටත්, අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තු සහ ආයතන ප්‍රධානීන් ඇතුළු එම කාර්ය මණ්ඩලත් අධිකරණ පරිපාලන විෂය සම්බන්ධ තීරණවල දී සහයෝගය දක්වන ගරු අගවිනිසුරුතුමිය ඇතුළු අධිකරණ සේවා කොමිෂන් සභාවටත් මාගේ කෘතඥතාව පළකරමි.

ජනාධිපති නීතීඥ අයෙෂා ජිනසේන
ලේකම්
අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

03. වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය :

වැය ශීර්ෂ 110

ජී.ඒ.ඒ-එස්

අධිකරණ, මහාධිනායාර කටයුතු හා ආඥාපනුම් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

සංශෝධිත අයවැය 2024		සටහන	2024	2023
ප්‍රතිපාදන			රු.	රු.
රු.				
-	ආදායම් ලැබීම්		-	-
-	ආදායම් බදු	1	-	-
-	වෙළඳාම් සේවා මත බදු	2	-	-
-	ජාතාන්තර වෙළඳාම් මත බදු	3	-	-
-	වෙනත් ආදායම් හා වෙනත්	4	-	-
-	මූල් ආදායම් ලැබීම් (අ)		-	-
-	ආදායම් නොවන ලැබීම්		-	-
-	භාණ්ඩාගාර අලිම		4,112,145,071	2,581,631,855
-	බැන්පතු		119,045,233	134,964,775
-	අත්තිකාරම් හිඟුම්		40,275,390	44,621,794
-	වෙනත් ප්‍රධාන ලෙජර් හිඟුම් ලැබීම්		11,948,194	-
-	මූල් ආදායම් නොවන ලැබීම් (ආ)		4,283,413,888	2,761,218,428
-	මූල් ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		4,283,413,888	2,761,218,428
-	භාණ්ඩාගාරයට ලප්‍රේෂණ (ඇ)		13,971,595	35,106,325
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(අ)		4,269,442,293	2,726,112,103

1

	අඩුකළා : වියදම්			
	පුනරාවර්තන වියදම්			
803,185,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	770,145,303	655,763,739
967,832,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	878,741,052	705,303,005
3,707,788,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	3,114,151,716	2,380,161,550
-	පොළී ගෙවීම්	8	-	-
225,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	57,450	78,000
5,479,030,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**4,763,095,521**	**3,741,306,294**
	මූලධන වියදම්			
2,891,420,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	74,462,968	80,088,051
2,259,254,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	2,177,287,226	951,139,582
608,663,172	ප්‍රාග්ධන මාරුකිරීම්	12	223,700,639	238,631,522
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-
2,275,000	හැකියා වර්ධනය	14	2,137,678	1,186,897
2,986,580,000	වෙනත් මූලධන වියදම්	15	129,936,384	170,189,296
8,748,192,172	මුළු මූලධන වියදම් (උ)		**2,607,524,895**	**1,441,235,348**
	තැන්පතු ගෙවීම්		66,914,968	64,636,249
	අත්තිකාරම් ගෙවීම්		51,126,183	49,316,214
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**118,041,151**	**113,952,463**
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**7,488,661,567**	**5,296,494,105**

2023 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඒ = (ඉ-එ)	(3,219,219,274)	(2,570,382,003)
අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය	(3,220,626,555)	(2,570,382,003)
දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය	1,407,281	-

සටහන:-
2024.12.31 දිනට නොපියවූ අග්‍රිම ශේෂය නියෝජනය කරනු ලබන්නේ 2024 පැවති මැතිවරණ සඳහා රාජකාරී දීමනා ගෙවීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් රාජ්‍ය නිලධාරීන්ට ගෙවන ලද මුදලයි. එය මැතිවරණ කොමිෂන් සභාව විසින් පියවිය යුතුවේ.

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 27.02.2025

ආර්.එම්.ඩී.කේ. රාමනායක
ප්‍රධාන මූල්‍ය නිලධාරි
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
කොළඹ 10.

ඒඑසිඒ-එල්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024		සටහන	තක්ෂ 2024	2023	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒඑසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		8,589,119,000	9,329,933,874	ඒඑසිඒ-3
-	තැන්පතු		17,803,355,776	16,763,087,720	ඒඑසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		477,608,002	454,639,060	ඒඑසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**26,870,082,778**	**26,547,660,654**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**26,870,082,778**	**26,547,660,654**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		550,000,000	794,305,253	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		26,320,082,778	25,753,355,401	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්		-	-	
8,065,820,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	8,027,353,535	6,823,928,795	
2,221,757,800.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	2,195,109,988	2,094,020,111	ඒඑසිඒ-2(ii)
252,380,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	233,567,089	250,670,241	
-	පොළී ගෙවීම්	8	-	-	
1,742,200.00	වෙනත් පුනරාවර්තන වියදම්	9	1,742,175	353,256	
10,541,700,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**10,457,772,786**	**9,168,972,403**	

		මූලධන වියදම්			
		මූලධන වත්කම් පුනරුත්ථාපනය හා			
701,000,000.00		වැඩිදියුණු කිරීම්	10	652,362,120	681,580,905
1,137,400,000.00		මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	1,109,145,847	1,137,735,397
37,100,000.00		ප්‍රාග්ධන මාරුකිරීම්	12	25,749,223	12,750,000 ඒඝිඒ-2(ii)
-		මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-
9,100,000.00		හැකියා වර්ධනය	14	8,725,519	3,903,280
-		වෙනත් මූලධන වියදම්	15	-	-
1,884,600,000.00		**මුළු මූලධන වියදම් (උ)**		**1,795,982,710**	**1,835,969,582**
		තැන්පතු ගෙවීම්		16,521,576,950	17,715,359,323 ඒඝිඒ-4
		අත්තිකාරම් ගෙවීම්		489,655,633	525,726,383 ඒඝිඒ-5
		වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-
		ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**17,011,232,583**	**18,241,085,706**
		මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		29,264,988,079	29,246,027,691
		දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(2,944,905,301)	(3,492,672,290)
		අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(2,969,050,236)	- ඒඝිඒ-7
		දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		24,144,935	ඒඝිඒ-3
				(2,944,905,301)	-

සටහන

2024.12.31 දිනට නොපියවූ අග්‍රිම ශේෂය නියෝජනය කරන ලබන්නේ **2024** පැවති මැතිවරණ සඳහා රාජකාරී දීමනා ගෙවීම් පදනා මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් රාජ්‍ය නිළධාරීන්ට ගෙවන ලද මුදලයි. එය මැතිවරණ කොමිෂන් සභාව විසින් පියවිය යුතුය.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

ආර්.ඒම්.ඩී.කේ. රාමනායක
ප්‍රධාන මූල්‍ය නිලධාරි
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

දිනය : 28/02/2025

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

වැය ශීර්ෂය110

ඒඩිඒ-පී

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2024 රු.	2023 රු.
		තක්ෂ	
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒඩිඒ-6	6,893,311,417	4,719,772,680
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් හිඟුම්	ඒඩිඒ-5/5(ඒ)	133,174,938	377,525,279
මුදල් හා මුදල් සමාන දෑ	ඒඩිඒ-3	1,407,281	-
මුළු වත්කම්		7,027,893,636	5,097,297,958
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(122,453,935)	(81,174,464)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		6,893,311,417	4,719,772,680
කුලී හා වෑඩ අත්තිකාරම් සංචිතය	ඒඩිඒ-5(බී)	31,571,360	286,772,495
ජංගම වගකීම්			
නැන්පතු හිඟුම්	ඒඩිඒ-4	224,057,513	171,927,248
අනිත්‍ය ශේෂය	ඒඩිඒ-3	1,407,281	-
මුළු වගකීම්		7,027,893,636	5,097,297,958

4

පිටු අංක 1 සිට 55 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 56 සිට 66 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 27.02.2025

ජනාධිපති නීතිඥ අයෙෂා ජිනසේන
ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

.....

ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 27.02.2025

ජනාධිපති නීතිඥ අයෙෂා ජිනසේන
ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 27.02.2025

ආර්.එම්.ඩී.කේ. රාමනායක
ප්‍රධාන මූල්‍ය නිලධාරි
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ණ්ඩුකම් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
කොළඹ 10.

ඒසිඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	20,581,202,128	17,695,442,112
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	1,811,557,632	1,831,517,229
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	24,144,935	-
මුළු වත්කම්		**22,416,904,695**	**19,526,959,341**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(13,427,597,993)	(12,157,866,798)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		20,581,202,128	17,695,442,112
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**	275,258,929	307,266,157

ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	14,963,896,696	13,682,117,870
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	24,144,935	-
මුළු වගකීම්		**22,416,904,695**	**19,526,959,341**

පිටු අංක.....1....සිට .....33... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ...34.... සිට ...54..... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට** අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 28/02/2025	දිනය : 28/02/2025	දිනය : 28/02/2025

ජනාධිපති නීතිඥ අයෙෂා ජිනසේන
ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

ජනාධිපති නීතිඥ අයෙෂා ජිනසේන
ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

ආර්.ඩබ්.ඩී.කේ. රාමනායක
ප්‍රධාන මූල්‍ය නිලධාරි
අධිකරණ, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සහ
භාණ්ඩාගාර ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
කොළඹ 10.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

වැය ශීර්ෂ 110

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

මහේස්ත්‍රාත් අධිකරණය කලවංචිකුඩි	මහජන බැංකුව -	කලවංචිකුඩි	190-1001-5-9026092	3,499,033.33		-	2023 දෙසැම්බර්
වාලච්චේන දිසා/මහේස්ත්‍රාත්අධිකරණය	මහජන බැංකුව -	වාලච්චේන	102-1001-6-0001268	2,008,802.50		-	2023 දෙසැම්බර්
යාපනය මහාධිකරණ කලාපය							
යාපනය මහාධිකරණය	මහජන බැංකුව -	යාපනය	104-1001-6-9026409	12,567,421.33	-	-	2023 දෙසැම්බර්
යාපනය සිවිල් අභියාචන මහාධිකරණය	මහජන බැංකුව -	යාපනය	104-1001-4-9026575	0.00	-	-	2023 දෙසැම්බර්
යාපනය දිසා අධිකරණය	මහජන බැංකුව -	යාපනය	104-1001-3-9026482	0.00	-	-	2023 දෙසැම්බර්
පේදුරුතුඩුව දිසා අධිකරණය	මහජන බැංකුව -	පේදුරුතුඩුව	106-1001-5-9026526	76,929.58	-	-	2023 දෙසැම්බර්
මල්ලාකම් දිසා අධිකරණය	මහජන බැංකුව -	චුන්නාකම්	109-1001-6-9026464	140,000.00	-	-	2023 දෙසැම්බර්
වාවාකච්චේරිය දිසා අධිකරණය	මහජන බැංකුව -	වාවාකච්චේරිය	110-1001-1-9026460	0.00	-	-	2023 දෙසැම්බර්
කයිට්ස් දිසා /මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	කයිට්ස්	105-1001-0-9026497	39,000.00	-	-	2023 දෙසැම්බර්
යාපනය මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	යාපනය	104-1001-5-9026481	1,083,721.00	-	-	2023 දෙසැම්බර්
පේදුරුතුඩුව මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	පේදුරුතුඩුව	285-1001-3-0037824	5,193,830.00	-	-	2023 දෙසැම්බර්
වාවාකච්චේරිය මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	වාවාකච්චේරිය	110 1001-9-9026461	-	-	-	2023 දෙසැම්බර්
මල්ලාකම් මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	චුන්නාකම්	109-1001-8-9026463	-	-	-	2023 දෙසැම්බර්
යාපනය ළමා මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	යාපනය	104-1001-1-9027411	2,412.00	-	-	2023 දෙසැම්බර්
මීගමුව මහාධිකරණ කලාපය							
මීගමුව මහාධිකරණය	මහජන බැංකුව -	මීගමුව	O34-1001-29026418	7,551,308.22		-	2023 දෙසැම්බර්
මීගමුව දිසා අධිකරණය	මහජන බැංකුව -	මීගමුව	O34-1001-39026521	227,536.20		-	2023 දෙසැම්බර්
දිසා අධිකරණය වැලිසර	මහජන බැංකුව -	චත්තල	22-21001490-27432	392,413.00		-	
මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	මීගමුව	O34-100-159026520	2,767,822.62		115,000.00	2023 දෙසැම්බර්
වැලිසර මහෙස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	චත්තල	22-21001090-26547	3,163,075.49		7,000.00	2023 දෙසැම්බර්
මිනුවන්ගොඩ දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	මිනුවන්ගොඩ	O21-1001-79026512	13,516,019.00		10,000.00	2023 දෙසැම්බර්
මීගමුව සිවිල් අභියාවනා මහාධිකරණය	මහජන බැංකුව -	මීගමුව	O34-1001-69027425	90,200.00		-	2023 දෙසැම්බර්

<u>ගම්පහ මහාධිකරණ කලාපය</u>							
මහාධිකරණය-ගම්පහ	මහජන බැංකුව -	ගම්පහ	026-1-001-7-9026430	23,648,951.93		45,376.80	2023 දෙසැම්බර්
සිවිල් අභියාචනා මහාධිකරණය-ගම්පහ	මහජන බැංකුව -	ගම්පහ	026-1-001-3-9026559	0.00		-	2023 දෙසැම්බර්
දිසා අධිකරණය - ගම්පහ	මහජන බැංකුව -	ගම්පහ	026-1-001-7-9026473	4,676,742.16		-	2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය- ගම්පහ	මහජන බැංකුව -	ගම්පහ	026-1-001-5-9026474	5,586,406.97		257,500.00	2023 දෙසැම්බර්
දිසා/ මහේස්ත්‍රාත් අධිකරණය- පූගොඩ	මහජන බැංකුව -	පූගොඩ	093-1-001-0-9026531	310,047.37		5,000.00	2023 දෙසැම්බර්
දිසා/ මහේස්ත්‍රාත් අධිකරණය- අත්තනගල්ල	මහජන බැංකුව -	නිට්ටඹුව	278-1-001-4-9026448	20,237,440.65		-	2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය- මහර	මහජන බැංකුව -	මහර	273-1-001-0-9027409	41,423,027.49		97,500.00	2023 දෙසැම්බර්
දිසා අධිකරණය- මහර	මහජන බැංකුව -	මහර	273-1-001-0-90227433	306,750.00		-	2023 දෙසැම්බර්
<u>කුරුණෑගල මහාධිකරණ කලාපය</u>							
මහාධිකරණය - කුරුණෑගල	මහජන බැංකුව -	කුරුණෑගල	012-100199026413	20,351,259.95		150.00	2023 දෙසැම්බර්
සිවිල් අභියාචනා මහාධිකරණය - කුරුණෑගල	මහජන බැංකුව -	කුරුණෑගල	012-100179026555	117,650.00			
දිසා අධිකරණය- කුරුණෑගල	මහජන බැංකුව -	කුරුණෑගල	012-100159026434	0.00			2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය- කුරුණෑගල	මහජන බැංකුව -	කුරුණෑගල	012-100119026501	24,946,354.33		15,000.00	2023 දෙසැම්බර්
දිසා අධිකරණය- කුලියාපිටිය	මහජන බැංකුව -	කුරුණෑගල	028-100109026499	0.00			2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය- කුලියාපිටිය	මහජන බැංකුව -	කුලියාපිටිය	028-100129026498	44,832,529.44			2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය- මහව	මහජන බැංකුව -	මහව	052-100109026502	5,819,242.99			2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය- ගල්ගමුව	මහජන බැංකුව -	ගල්ගමුව	184-100119026470	5,288,063.00		6,500.00	2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය- වාරියපොල	මහජන බැංකුව -	වාරියපොල	163-100139026546	22,451,425.11			2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය- පිලැස්ස	මහජන බැංකුව -	මාවතගම	199-100189026500	236,110.00			2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය- රම්බඩගල්ල	මහජන බැංකුව -	රීදීගම	193-100109027380	119,000.00			2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය- නිකවැරටිය	මහජන බැංකුව -	නිකවැරටිය	124100100052564	141,000.00		1,000.00	2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය- හෙට්ටිපොල	මහජන බැංකුව -	හෙට්ටිපොල	144-100179027391	18,939,017.40		5,000.00	2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය- පොල්ගහවෙල	මහජන බැංකුව -	පොල්ගහවෙල	059-100149027407	0.00			2023 දෙසැම්බර්
මහාධිකරණය -කුලියාපිටිය	මහජන බැංකුව -	කුලියාපිටිය	028-100189027414	0.00			2023 දෙසැම්බර්

මහනුවර මහාධිකරණ කලාපය							
මහනුවර මහාධිකරණය	මහජන බැංකුව -	මහනුවර	003-1-001-4-9026406	28,231,394.04		3,300.00	2023 දෙසැම්බර්
මහනුවර දිසා අධිකරණය	මහජන බැංකුව -	මහනුවර	003-1-001-8-9026490	750.00		750.00	2023 දෙසැම්බර්
මහනුවර සිවිල් අභියාචන මහාධිකරණය	මහජන බැංකුව -	මහනුවර	003-1-001-8-9026560	159,639.00		-	2023 දෙසැම්බර්
මහනුවර මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	මහනුවර	003-1-001-8-9026491	30,623,107.29		82,250.00	2023 දෙසැම්බර්
නාවලපිටිය දිසා අධිකරණය	මහජන බැංකුව -	නාවලපිටිය	053-1-001-3-9026519	25,018,253.00		57,530.00	2023 දෙසැම්බර්
මාතලේ දිසා අධිකරණය	මහජන බැංකුව -	මාතලේ	002-1-001-2-9026506	2,897,540.52		20,000.00	2023 දෙසැම්බර්
ගම්පොල දිසා අධිකරණය	මහජන බැංකුව -	ගම්පොල	018-1-001-2-9026475	33,099,679.83		-	2023 දෙසැම්බර්
තෙල්දෙණිය දිසා අධිකරණය	මහජන බැංකුව -	තෙල්දෙණිය	112-1-001-0-9026539	4,702,402.00		-	2023 දෙසැම්බර්
දඹුල්ල දිසා අධිකරණය	මහජන බැංකුව -	දඹුල්ල	138-1-001-2-9026468	0.00		-	2023 දෙසැම්බර්
නාවුල මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	නාවුල්ල	146-1-001-2-9027400	9,340,026.00		1,229.00	2023 දෙසැම්බර්
ගලගෙදර මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	ගලගෙදර	114-1-001-2-0065811	40,000.00		-	2023 දෙසැම්බර්
මහාධිකරණය- මාතලේ	මහජන බැංකුව -	මහනුවර	002-1-001-6-9027429	92,050.00		-	
අවිස්සාවේල්ල මහාධිකරණ කලාපය							
මහාධිකරණය - අවිස්සාවේල්ල	මහජන බැංකුව -	අවිස්සාවේල්ල	029-100139026398	5,844,264.81		2,200.00	2023 දෙසැම්බර්
සිවිල් අභි.මහා. - අවිස්සාවේල්ල	මහජන බැංකුව -	අවිස්සාවේල්ල	029-1001290027379	11,600.00			
දිසා අධිකරණය - අවිස්සාවේල්ල	මහජන බැංකුව -	අවිස්සාවේල්ල	029-100129026450	152,065.00		1,500.00	2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය - අවිස්සාවේල්ල	මහජන බැංකුව -	අවිස්සාවේල්ල	029-1001-4-9026449	27,206,503.37		26,250.00	2023 දෙසැම්බර්
රත්නපුර මහාධිකරණ කලාපය							
මහාධිකරණය-රත්නපුර	මහජන බැංකුව -	රත්නපුර	088-100129026562	21,250,264.85		52,523.84	2023 දෙසැම්බර්
දිසා අධිකරණය-රත්නපුර	මහජන බැංකුව -	රත්නපුර	088-100119026534	0.00		-	2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය-රත්නපුර	මහජන බැංකුව -	රත්නපුර	088-1001-39026533	1,165,086.97		11,500.00	2023 දෙසැම්බර්
සිවිල්අභියාචන මහාධි-රත්නපුර	මහජන බැංකුව -	රත්නපුර	088-100299026577	103,140.00		-	2023 දෙසැම්බර්
දිසා මහේ.අධිකරණය-පැල්මඩුල්ල	මහජන බැංකුව -	පැල්මඩුල්ල	160-1001-59026523	3,764,510.67		-	2023 දෙසැම්බර්
දිසා මහේ.අධිකරණය-බලංගොඩ	මහජන බැංකුව -	බලංගොඩ	17100109026453	6,320,313.22		-	2023 දෙසැම්බර්
මහාධිකරණය-ඇඹිලිපිටිය	මහජන බැංකුව -	ඇඹිලිපිටිය	045-1001-0-9026564	83,000.00		-	2023 දෙසැම්බර්
දිසා අධිකරණය-ඇඹිලිපිටිය	මහජන බැංකුව -	ඇඹිලිපිටිය	045-1-001-1-902643	2,500.00		-	2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය-ඇඹිලිපිටිය	මහජන බැංකුව -	ඇඹිලිපිටිය	045-1001-89026433	2,049,952.00		-	2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය-කලවාන	මහජන බැංකුව -	කලවාන		2,280,762.04		-	

බදුල්ල මහාධිකරණ කලාපය							
මහාධිකරණය බදුල්ල	මහජන බැංකුව -	මුතියංගනය	269-100129026416	18,548,616.67		-	2023 දෙසැම්බර්
සිවිල් අභියාචනා මහාධිකරණය	මහජන බැංකුව -	මුතියංගනය	269-100159026561	0.00		-	2023 දෙසැම්බර්
දිසා අධිකරණය බදුල්ල	මහජන බැංකුව -	මුතියංගනය	269-100149026566	2.00		-	2023 දෙසැම්බර්
දිසා අධිකරණය, බණ්ඩාරවෙල -	මහජන බැංකුව -	බණ්ඩාරවෙල	037-100119026455	84,592.32		-	2023 දෙසැම්බර්
දිසා අධිකරණය, වැලිමඩ	මහජන බැංකුව -	වැලිමඩ	016-100169026549	180,368.00		7,500.00	2023 දෙසැම්බර්
දිසා අධිකරණය- මහියංගනය	මහජන බැංකුව -	මහියංගණය	058-100129026503	6,927,105.00		-	2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය-බදුල්ල	මහජන බැංකුව -	මුතියංගනය	269-100179026452	147,648.00		-	2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය-බණ්ඩාරවෙල	මහජන බැංකුව -	බණ්ඩාරවෙල	037-100199026456	20,617,165.90		10,000.00	2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය-පස්සර	මහජන බැංකුව -	පස්සර	116100139026102	96,540.00			
අනුරාධපුරය මහාධිකරණ කලාපය							
අනුරාධපුරය මහාධිකරණය	මහජන බැංකුව -	අනුරාධපුරය	81-001-09026397	15,778,824.26		-	2023 දෙසැම්බර්
අනුරාධපුරය සිවිල් අභියාචන මහාධිකරණ	මහජන බැංකුව -	අනුරාධපුරය	81-001-69026554	0.00		-	2023 දෙසැම්බර්
අනුරාධපුරය දිසා අධිකරණය	මහජන බැංකුව -	අනුරාධපුරය	81-001-59026446	96,910.33		-	2023 දෙසැම්බර්
අනුරාධපුරය මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	අනුරාධපුරය	81-001-39026447	12,033,468.17		-	2023 දෙසැම්බර්
කැබිතිගොල්ලෑව මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	කැබිතිගොල්ලෑව	150-100149026483	759,177.22		-	2023 දෙසැම්බර්
කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	කැකිරාව	42-100-119026485	6,284,004.00		-	2023 දෙසැම්බර්
තඹුත්තේගම මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	තඹුත්තේගම	219-100-149026538	1,012,202.00		-	2023 දෙසැම්බර්
මැදවච්චිය මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	මැදවච්චිය	96-100-150098284	1,781,514.92		-	2023 දෙසැම්බර්
නොච්චියාගම මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	නොච්චියාගම	17-110-0169027436	5,623,308.43		-	2023 දෙසැම්බර්
කහටගස්දිගිලිය මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	කහටගස්දිගිලිය	10-0139027435	236,555.00		-	2023 දෙසැම්බර්
කෑගල්ල මහාධිකරණ කලාපය							
01. මහාධිකරණය-කෑගල්ල	මහජන බැංකුව -	කෑගල්ල	29-9100-17-9026411	7,996,414.36		10,552.00	2023 දෙසැම්බර්
02.දිසා අධිකරණය-කෑගල්ල	මහජන බැංකුව -	කෑගල්ල	29-9100-18-9026496	0.00		-	2023 දෙසැම්බර්
03.මහේස්ත්‍රාත් අධිකරණය-කෑගල්ල	මහජන බැංකුව -	කෑගල්ල	29-9100-10-9026495	497,340.00		14,000.00	2023 දෙසැම්බර්
04.මාවනැල්ල දිසා මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	මාවනැල්ල	69-1001-290-26-511	2,685,157.22		10,000.00	2023 දෙසැම්බර්
05.වරකාපොල දිසා මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	නිහාරිය	27-0100-14-9026541	3,257,003.00		2,500.00	2023 දෙසැම්බර්
06.සිවිල් අභියාචනා මහාධිකරණය	මහජන බැංකුව -	කෑගල්ල	29-9100-19-9026556	80.00			2023 දෙසැම්බර්
07.රුවන්වැල්ල දිසා මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	රුවන්වැල්ල	081-1001-5-9026535	370,719.00		5,000.00	2023 දෙසැම්බර්

හලාවත මහාධිකරණ කලාපය							
හලාවත මහාධිකරණය	මහජන බැංකුව -	හලාවත	024-1-001-8-9026402	1,328,813.65		-	2023 දෙසැම්බර්
හලාවත දිසා /මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	හලාවත	024-1-001-2-9026462	37,134,225.62		-	2023 දෙසැම්බර්
මාරවිල දිසා /මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	මාරවිල	332-1-001-6-9026515	32,286,747.50		-	2023 දෙසැම්බර්
වවුනියාව මහාධිකරණ කලාපය							
වවුනියාව මහාධිකරණය	මහජන බැංකුව	වවුනියාව	40-100-109026420	6,875,122.65		-	2023 දෙසැම්බර්
වවුනියාව සිවිල් අභියාචන මහාධිකරණය	මහජන බැංකුව	වවුනියාව	040-100-139027376	4,090.00		-	2023 දෙසැම්බර්
වවුනියාව දිසා අධිකරණය	මහජන බැංකුව	වවුනියාව	040-100-189026548	145,000.00		-	2023 දෙසැම්බර්
මන්නාරම මහාධිකරණය	මහජන බැංකුව	වවුනියාව	004-1-001-6-9027410	0.00		-	2023 දෙසැම්බර්
මන්නාරම දිසා අධිකරණය	මහජන බැංකුව	මන්නාරම	044-1001-99026414	0.00		-	2023 දෙසැම්බර්
මන්නාරම මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව	මන්නාරම	044-1001-19027403	0.00		-	2023 දෙසැම්බර්
කිලිනොච්චි මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව	කිලිනොච්චිය	048-100139027396	9,178,397.00		-	2023 දෙසැම්බර්
මුලතිවු දිසා අධිකරණය	මහජන බැංකුව	මුලතිවු	020-100-199037399	1,495,662.33		-	2023 දෙසැම්බර්
කිලිනොච්චි මහාධිකරණය	මහජන බැංකුව	කිලිනොච්චිය	048-1-001-2-9027434	0.00		-	2023 දෙසැම්බර්
අම්පාර මහාධිකරණ කලාපය							
අම්පාර මහාධිකරණය	මහජන බැංකුව -	අම්පාර	015-100-159026423	11,544,782.15		5,900.00	2023 දෙසැම්බර්
අම්පාර දිසා අධිකරණය	මහජන බැංකුව -	අම්පාර	015-10011902644	5,399,925.30			2023 දෙසැම්බර්
දෙහිඅත්තකන්ඩිය මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	දෙහිඅත්තකන්ඩිය	33-0100199027405	2,237,367.49			2023 දෙසැම්බර්
ත්‍රිකුණාමලය මහාධිකරණ කලාපය							
ත්‍රිකුණාමලය මහාධිකරණය	මහජන බැංකුව -	ත්‍රිකුණාමලය	066-1001-1-9026419	16,828,959.12		10,260.00	2023 දෙසැම්බර්
ත්‍රිකුණාමලය සිවිල් අභියාචන මහාධිකරණය	මහජන බැංකුව -	ත්‍රිකුණාමලය	066-1002-9-9027377	42,210.00		-	2023 දෙසැම්බර්
ත්‍රිකුණාමලය දිසා අධිකරණය	මහජන බැංකුව -	ත්‍රිකුණාමලය	066-1001-0-9026542	116,900.00		-	2023 දෙසැම්බර්
ත්‍රිකුණාමලය මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	ත්‍රිකුණාමලය	066-1001-8-9026543	6,321,208.25		-	2023 දෙසැම්බර්
මූර්තුර් දිසා /මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	මූර්තුර්	095-1001-7-0000630	6,643,538.00		44,000.00	2023 දෙසැම්බර්
කන්තලේ දිසා /මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	කන්තලේ	095-1001-8-9026492	149,398.98		-	2023 දෙසැම්බර්

නුවරඑළිය මහාධිකරණ කලාපය							
මහාධිකරණය -නුවරඑළිය	මහජන බැංකුව -	නුවරඑළිය	134-100-209027390	3,893,134.59		-	2023 දෙසැම්බර්
දිසා අධිකරණය-නුවර එළිය	මහජන බැංකුව -	නුවරඑළිය	134-100-109026522	0.00		-	2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය-නුවර එළිය	මහජන බැංකුව -	නුවරඑළිය	134-100-229027389	160,505.00		-	2023 දෙසැම්බර්
දිසා/මහේස්ත්‍රාත් අධිකරණය -හැටන්	මහජන බැංකුව -	හැටන්	186-100-129026478	3,586,281.02		-	
දිසා/මහේස්ත්‍රාත් අධිකරණය -වලපනේ	මහජන බැංකුව -	වලපනේ	127-100-120000346	186,308.00		-	2023 දෙසැම්බර්
මොණරාගල මහාධිකරණ කලාපය							
මොණරාගල මහාධිකරණය	මහජන බැංකුව -	මොණරාගල	68-100-119027385	1,849,827.37		-	2023 දෙසැම්බර්
මොණරාගල දිසා අධිකරණය	මහජන බැංකුව -	මොණරාගල	68-100-159026435	2,523,973.46		-	2023 දෙසැම්බර්
වැල්ලවාය දිසා/මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	වැල්ලවාය	62-100-179026545	132,500.00		-	2023 දෙසැම්බර්
බිබිල මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	බිබිල	11-100-139027406	610,000.00		-	2023 දෙසැම්බර්
සියඹලාන්ඩුව මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	සියඹලාන්ඩුව	68-100-149027416	56,320.00		-	2023 දෙසැම්බර්
පොළොන්නරුව මහාධිකරණ කලාපය							
පොළොන්නරුව මහාධිකරණය	මහජන බැංකුව	පොළොන්නරුව	232-100-109026570	17,500,155.59		-	2023 දෙසැම්බර්
දිසා/මහේස්ත්‍රාත් අධිකරණය-	මහජන බැංකුව	පොළොන්නරුව	232-100-149026530	51,126,166.98		-	2023 දෙසැම්බර්
දිසා/මහේස්ත්‍රාත් අධිකරණය-	මහජන බැංකුව	හිඟුරක්ගොඩ	66-100-239027391	1,990,534.25		-	2023 දෙසැම්බර්
කල්මුණේ මහාධිකරණ කලාපය							
කල්මුණේ මහාධිකරණය	මහජන බැංකුව -	කල්මුණේ	023-1001-89027384	4,165,435.62		-	2023 දෙසැම්බර්
කල්මුණේ දිසා අධිකරණය	මහජන බැංකුව -	කල්මුණේ	023-1001-09026487	0.00		-	2023 දෙසැම්බර්
කල්මුණේ මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	කල්මුණේ	023-1001-29026486	1,378,533.00		-	2023 දෙසැම්බර්
සමන්තුරේ මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	සමන්තුරේ	064-1001-59027413	96,331.00		-	2023 දෙසැම්බර්
අක්කරේපත්තු මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	අක්කරේපත්තු	063-1001-99027402	10,493,665.93		-	2023 දෙසැම්බර්
අක්කරේපත්තු දිසා අධිකරණය	මහජන බැංකුව -	අක්කරේපත්තු	063-1001-40001753	0.00		-	2023 දෙසැම්බර්
පොතුවිල් දිසා/මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	පොතුවිල්	164-1001-00033081	829,755.00		-	2023 දෙසැම්බර්

තංගල්ල මහාධිකරණ කලාපය							
තංගල්ල මහාධිකරණය	මහජන බැංකුව -	තංගල්ල	067-100-130020364	21,931,474.78		-	2023 දෙසැම්බර්
තංගල්ල සිවිල් අභියාචන මහාධිකරණ	මහජන බැංකුව -	තංගල්ල	067-100-119027404	0.00		-	2023 දෙසැම්බර්
හම්බන්තොට මහාධිකරණය	මහජන බැංකුව -	හම්බන්තොට	007-100-169026408	90,000.00		15,000.00	
හම්බන්තොට දිසා අධිකරණය	මහජන බැංකුව -	හම්බන්තොට	007-100119026477	3,512,760.67		-	
තිස්සමහාරාමය දිසා අධිකරණය	මහජන බැංකුව -	තිස්සමහාරාමය	061-100-109026568	26,745,232.02		-	
වලස්මුල්ල දිසා අධිකරණය	මහජන බැංකුව -	වලස්මුල්ල	120-100-109026544	5,774,105.75		-	
තංගල්ල දිසා අධිකරණය	මහජන බැංකුව -	තංගල්ල	067-100-119026536	3,073,719.15		-	2023 දෙසැම්බර්
අහුණකොළපැලැස්ස මහේස්ත්‍රාත් අධිකරණය	මහජන බැංකුව -	හම්බන්තොට	205-100-159027408	9,821,459.84		3,000.00	2023 දෙසැම්බර්
පුත්තලම මහාධිකරණ කලාපය							
මහාධිකරණය-පුත්තලම	මහජන බැංකුව	පුත්තලම	91-00189026576	5,005,122.04		-	2023 දෙසැම්බර්
දිසා අධිකරණය-පුත්තලම	මහජන බැංකුව	පුත්තලම	91-00119026532	21,352,153.00		-	2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය-ආණමඩුව	මහජන බැංකුව	ආණමඩුව	267-100-159027415	120,500.00		-	2023 දෙසැම්බර්
හෝමාගම මහාධිකරණය							
මහාධිකරණය-හෝමාගම	මහජන බැංකුව	හෝමාගම	049-100149027423	7,366,100.28		70,950.00	2023 දෙසැම්බර්
සිවිල් අභියාචන මහාධිකරණය-හෝමාගම	මහජන බැංකුව	හෝමාගම	049-100159027427	19,290.00		-	
දිසා අධිකරණය-හෝමාගම	මහජන බැංකුව	හෝමාගම	049-100180051463	106,500.00		-	2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය-හෝමාගම	මහජන බැංකුව	හෝමාගම	049-100179026479	12,335,120.00		-	2023 දෙසැම්බර්
දිසා අධිකරණය-කඩුවෙල	මහජන බැංකුව	හෝමාගම	19-61100189026484	1,062,056.00		-	2023 දෙසැම්බර්
මහේස්ත්‍රාත් අධිකරණය-කඩුවෙල	මහජන බැංකුව	හෝමාගම	19-6100179027422	893,189.80		-	2023 දෙසැම්බර්

ඉහත සඳහන් කොරතුරු සත්‍ය හා නිවැරදි බවට නහවුරු කරමි.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 28/ 02/ 2025

ආර්.එම්.ඩී.කේ. රාමනායක
ප්‍රධාන මූල්‍ය නිලධාරි
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
කොළඹ 10.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය:

<u>වැය ශීර්ෂය 110</u>

(,000)

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රු)	අවසන් ඇස්තමේන්තුව (රු)	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002-01-01	ගොඩනැගිලි කුළිය	600	600	270	45%
2002-02-99	පොළිය	1,500	3000	3,409	114%
2003-02-99	විකුණුම්,ලද ගාස්තු	13,000	14,000	14,796	106%
20.04.01.00	වැන්දඹු හා අනත්දරු	-	-	27,528	0%
2006-02-02	වෙනත් ප්‍රාග්ධන වත්කම්	150	150	124	83%
	එකතුව	15,250	17,750	46,127	260%

<u>වැය ශීර්ෂය 228</u>

(,000)

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රු)	අවසන් ඇස්තමේන්තුව (රු)	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20-02-01-01	රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී ආදායම	35,000	35,000	63,375	181%
20-02-02-99	පොළිය -අනෙකුත්	40,000	40,000	62,552	156%
20-03-02-99	පරිපාලනමය ගාස්තු - විවිධ (මුද්දර ගාස්තු)	200,000	200,000	177,420	89%
20-03-03-02	දඩමුදල් හා රාජසන්තක කිරීම්	1,300,000	1,300,000	1,755,230	135%
20-03-99-00	වෙනත් ආදායම්	400,000	400,000	289,057	72%
20-06-02-02	වෙනත්	12,000	12,000	20,374	170%
	එකතුව	2,652,000	1,987,000	2,368,008	119.18%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය:

<u>වැය ශීර්ෂය 110</u>

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	4,938,700	5,479,030	4,763,096	87%
ප්‍රාග්ධන	7,472,200	8,748,192	2,607,525	30%
එකතුව	12,410,900	14,227,222	7,370,620	52%

<u>වැය ශීර්ෂය 228</u>

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	9,305,200	10,555,845	10,455,295	99.04%
ප්‍රාග්ධන	1,818,000	1,884,600	1,795,983	95.29%
එකතුව	11,123,200	12,440,445	12,251,278	98.48%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

වැය ශීර්ෂය: 110

රු. ,000

	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	අධිකරණ පරිපාලන	පුද්ගල පඩි	2,340	2,340	2,072.20	89%
02	අධිකරණ පරිපාලන	අතිකාල දීමනා	140	140	88.31	63%
03	අධිකරණ පරිපාලන	වෙනත් දීමනා	2,165	2,202.50	2,202.42	100%
04	අධිකරණ පරිපාලන	ගමන් වියදම්	1	1	0.7	70%
05	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	පුද්ගල පඩි	129	322	318.21	99%

06	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය	වෙනත් දීමනා	81	233	233	100%

වැය ශීර්ෂය: 228

(රු. ,000)

	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	සෞඛ්‍ය අමාත්‍යාංශය	අධිකරණ වෛද්‍ය නිළධාරීන්ගේ ප්‍රවාහන හා ඉන්ධන දීමනාව	-	37,167	32,481	87.39%
02	මුලතිව් දිස්ත්‍රික්කයේ ලේකම් කාර්යාලය	සමූහ මිනීවලවල් කැනීම් කටයුතු සදහා	-	9,700	6,137	63.27%
03	ගොඩනැගිලි දෙපාර්තමේන්තුව	කුරුණෑගල වහලය අලුත්වැඩියා කිරීම හා අම්පාර අධිකරණ සංකීර්ණයේ අත්‍යාවශ්‍ය විදුලි සැපයුමට අදාල කටයුතු	-	65,840	28,696	43.58%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය:

වැය ශීර්ෂය 110

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	827,153	827,153		100%
9152	යන්ත්‍රෝපකරණ	746,393	746,393		100%
9153	ඉඩම්	400,950	400,950		100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-		-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		-
9160	කෙරීගෙන යන වැඩ	4,918,815	4,918,815		100%
9180	බදු දෙන ලද වත්කම්	-	-		

වැය ශීර්ෂය 228

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2024** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2024** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	6,480,353	6,480,353	-	100%
9152	යන්ත්‍රෝපකරණ	1,527,942	1,527,942	-	100%
9153	ඉඩම්	4,886,407	4,886,407	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	7,686,499	7,686,499	-	100%
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

වැය ශීර්ෂ 110



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය எனது இல. My No.	JLO/A/MOJ/FA/2024/25	මගේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2025 ජූනි 26 දින

ලේකම්

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

ශීර්ෂය 110 - අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 110 - අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වියවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු

ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කළින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන, පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.6.1 **මූල්‍ය නොවන වත්කම්**

භාණ්ඩාගාර මුද්‍රිත SA 10 අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් මිලදීගැනීම් වටිනාකම රු.6,763,417ක් වුව ද, භාණ්ඩාගාර මුද්‍රිත SA 82 අනුව එහි වටිනාකම රු.6,526,162ක් වූයෙන් රු.237,255ක් අඩුවෙන් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත්කර තිබුණි.

1.6.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

දේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති 03ක් සඳහා ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පවරාදී ඊට අදාළව රු.46,990,768ක වියදම් සිදුකර තිබුණ ද, එම වියදම් තහවුරු කිරීමට අදාළ වියදම් වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොවී ය.

1.6.3 **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 1647(ඉ) අනුව වාහන ලේඛනය සහ වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීනකර නොතිබුණි.

2. **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **වියදම් කළමනාකරණය**

(අ) පුනරාවර්තන වැය විෂයයන් 14කට හා මූලධන වැය විෂයයන් 16කට අදාළව ප්‍රතිපාදනවල එකතුව රු.3,148,260,000ක් සම්පූර්ණයෙන්ම වැයනොකර ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 04කට අදාළව මුදල් රෙගුලාසි 66 මඟින් එකතුව රු.3,375,000ක ප්‍රතිපාදන මාරුකර තිබුණ ද, එම මාරුකරන ලද ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි.

(ඇ) 110-1-1-0-1003-0/11 වැය විෂයය සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.1,880,000ක මුදලක් වෙන්කර ගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානයට එසේ වෙන්කරන ලද වටිනාකම සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණු අතර, එම වැය විෂයයේ ප්‍රතිපාදනවල මුළු ඉතිරිය රු.2,393,369ක් විය.

(ඈ) පුනරාවර්තන වැය විෂයයන් 21ක සහ මූලධන වැය විෂයයන් 11ක ප්‍රතිපාදිත රු.2,326,071,250කින් රු.1,406,807,233ක් ඉතිරි වී තිබූ අතර, එය සියයට 16 සිට 98ක පරාසයක් දක්වා විහිදී තිබුණි.

(ඉ) 110-1-2-24-2509-17 වැය විෂයය එනම් ශ්‍රී ලංකා අධිකරණ ක්ෂේත්‍රය සඳහා සහයෝගය දැක්වීමේ ප්‍රගතිය වෙනුවෙන් රු.19,490,000ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද, 2024 ජූනි මස අන්තර්ජාල පහසුකම් ලබාගැනීම වෙනුවෙන් වැටිබදු වියදම වන රු.224,796ක් පමණක් මෙම වැය විෂයය යටතේ වැයකර තිබුණි.

3.2 **නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	**අනුකූල නොවීම**
2018 ජනවාරි 24 දිනැති අංක 5/2018 (I) වක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 5/2008 දරන වක්‍රලේඛය	පූරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර නොතිබුණි.

3.3 **තැන්පතු**

ව්‍යාපෘති කටයුතු අවසන් වී තැන්පතු මුදල් නිදහස් කිරීමට හැකි රැඳවුම් මුදල් තැන්පතු 6ක රු.9,690,402ක් මුදල් නිදහස් කිරීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට කටයුතුකර නොතිබුණු අතර, එම වටිනාකම පොදු තැන්පතු ගිණුමේ තවදුරටත් රඳවාගෙන තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

4.1.1 **කාර්යභාරයන් ඉටුනොකිරීම**

(අ) අධිකරණ අංශයට සහාය දැක්වීමේ ව්‍යාපෘතියෙන් (SJSP) රුපියල් මිලියන 15ක අරමුදල් උපයෝගී කරගෙන ප්‍රාදේශීය පුහුණු වැඩසටහන් මඟින් නිලධාරීන් 3000ක්

පූහුණු කිරීමට සැලසුම්කර තිබුණ ද, අරමුදල් නොලැබීම හේතුවෙන් ක්‍රියාත්මකකර නොතිබුණි.

(ආ) තොරතුරු තාක්ෂණය මත පදනම් වූ ගිණුම්කරණ පුහුණු වැඩසටහන සඳහා රු.300,000ක් ඇස්තමේන්තු කළ අතර, මෙමඟින් නිලධාරීන් 250කට ආසන්න ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට පූහුණුකර අවසන් කිරීමට නියමිත වුව ද, මෙම වැඩසටහන ආරම්භකර නොතිබුණි.

(ඇ) ජාතික ඒකාබද්ධතා අංශය යටතේ ක්‍රියාත්මක වන සහජීවන සංගම් පිහිටුවීම හා ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා (110-1-5-14-2509) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22ක් සඳහා රු.584,075ක ලබාදී තිබූ ප්‍රතිපාදන වැයකර නොතිබුණි.

(ඈ) 2016 මාර්තු 29 දින සහ 2023 ජුනි 09 දින පැවති රාජ්‍ය ගිණුම්කාරක සභාව මඟින් ලබාදෙන ලද නියෝග ප්‍රකාරව 1877 අංක 16 දරන බන්ධනාගාර ආඥාපනත වෙනුවට නව පනතක් සකස්කිරීමේ කටයුතු ද 2024 දෙසැම්බර් 31 දින දක්වා අවසන් කර නොතිබුණි.

4.1.2 **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම**

සමථකරණ නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂයේදී පැවැත්වීමට සැලසුම්කර තිබූ මුළු පූහුණු වැඩසටහන් සංඛ්‍යාව 203ක් වූ අතර, වර්ෂය තුළදී රජයේ ප්‍රතිපාදන මඟින් හා SEDR ව්‍යාපෘතිය යටතේ සිදුකර ඇති මුළු වැඩසටහන් ප්‍රමාණය 40ක් වූ අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 19ක් වැනි අවම මට්ටමක පැවතුණි.

4.2 **ප්‍රසම්පාදනයන්**

(අ) Fabrication of Record room racks for the court of Appeal රුපියල් මිලියන 15.7කට පෞද්ගලික ආයතනයක් වෙත 2024 ඔක්තෝබර් 23 වන දින ප්‍රදානයකර තිබුණ ද, අදාළ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ගිවිසුම් ගතවී තිබුණේ 2024 නොවැම්බර් 22 වන අතර, ඒ සඳහා මාසයකට ආසන්න කාලයක් ගතකර තිබුණි. මෙම වාර්තාවේ දින දක්වා අදාළ කාර්යය නිමකර නොතිබුණි.

(ආ) දිවුරුම් කොමසාරිස්, හදිසි මරණ පරීක්ෂක, සාමදාන විනිසුරු හා දිවුරුම් දුන් භාෂා පරිවර්තක තනතුරු සඳහා තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීමේ කාර්යය මාස 03ක් ඇතුළත ~~කෘෂ්ඡඤ~~ රු.20,095,000කට නිම කිරීමට 2024 ජුනි 19 දින තෝරාගත් කොන්ත්‍රාත් ආයතනය සමඟ ගිවිසුම් ගත වී තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ අවසාන වන තෙක් කාර්යය නිමකර නොතිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

(අ) අධිකරණ නිලධාරීන් පුහුණු කිරීමේ ඒකකයේ ක්‍රියාකාරකමක් වන පරිගණක පුහුණු වැඩසටහන් සිදුකිරීම වර්ෂය තුළ ආරම්භකර නොතිබුණු අතර, පරිගණක ඒකකය ද, ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. පරිගණක විද්‍යාගාරයේ පවතින CPU 23ක්, හා Monitor 26ක් හා UPS 39ක් හා ලිබඩු උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

(ආ) යතුරු පැදියක් හා ත්‍රිරෝද රථයක් අපහරණය කිරීම සඳහා යෝජනාකර තිබුණ ද, එය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ද අපහරණය කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) කැබ් රථයක් අනතුරට පත් වී වසර 06 කට වැඩි කාලයක් ගත වී තිබුණ ද, මෙම රථයේ චැසි අංකය හා එංජින් අංකය මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත හා නොගැළපීම හේතුවෙන් මෝටර්රථ දෙපාර්තමේන්තුව විසින් විමර්ශණ කටයුතු සිදුකරමින් පවතී. එම විමර්ශණ කටයුතු ආරම්භකර වසරකට අධික කාලයක් ගත වී තිබුණ ද, අවසන්කර නොතිබුණි.

(ඈ) ජනාධිපති කාර්යාලය, ධීවර අමාත්‍යාංශය හා අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 04ක් ද ඇතුළත්ව ආයතන 06ක් සඳහා වාහන 12ක් ලබාදී තිබුණු අතර, ඒවා නැවත පවරාගැනීමට හෝ එම ආයතනවලට පැවරීමට කටයුතුකර නොතිබුණි.

(ඉ) අධිකරණ අමාත්‍යාංශය විසින් භුක්ති විඳින නුවරඑළිය සංචාරක බංගලාව පිහිටි හෙක්ටයාර් 0.2023ක් වූ ඉඩම, රක්වාන සංචාරක බංගලාව පිහිටි රූඩ් 01 පර්චර්ස් 10ක් වූ ඉඩම, බත්තරමුල්ල ළමා මහේස්ත්‍රාත් අධිකරණය පිහිටි හෙක්ටයාර් 0.1760ක් වූ ඉඩම හා අධිකරණ පියස ඉදිකරන BCC ලංකා සමාගමට අයත් හෙක්ටයාර් 2.4281 (අක්කර 06) ඉඩම් පවරාගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේ ද අවසන්කර නොතිබුණි.

4.4 රජයේ නිලධාරීන් ඇපකැබීම

මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව හා රජයේ නිලධාරීන්ගේ ඇපආඥා පනත හා අධිකරණ අමාත්‍යාංශයේ 2011 ජනවාරි 18 දිනැති 01/2011 චක්‍රලේඛය ප්‍රකාරව ඇපකැබිය යුතු නිලධාරීන් 12 දෙනෙකු 2024 දෙසැම්බර් 31 දින වන විට ඇපකබා නොතිබුණි.

4.5 කළමනාකරණ දුර්වලතා

(අ) WPPH 1287 දරන කැබ් රථය 2020 ජනවාරි 17 දින අනතුරකට ලක්වී තිබුණු අතර, 2021 නොවැම්බර් මස ඉදිරිපත් කරන ලද මුදල් රෙගුලාසි 104(4) යටතේ අලාභයන් පිළිබඳ අවසාන වාර්තාව අනුව රක්ෂණ ආයතනයෙන් ප්‍රතිපූරණය නොකරන ලද රු.218,175ක හිඟ මුදල රියදුරුගෙන් අයකර ගැනීමට නිර්දේශකර තිබුණ ද, එය අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) 2024 අප්‍රේල් 09 වන දින WPPH 1288 දරන රථයේ ඉදිරිපස අංක තහඩුව අස්ථානගත වීම සම්බන්ධව මුදල් රෙගුලාසි 104(3) යටතේ අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක වාර්තාවක් 2024 අප්‍රේල් 10 දින ඉදිරිපත්කර තිබුණ ද, අවසන් වාර්තාව විගණිත දින වන විටත් නිකුත්කර නොතිබුණි. තව ද, මෙම කැබ් රථය 2024 අගෝස්තු 26 දින ද අනතුරකට ලක්වී තිබුණි.

(ඇ) සමථ මූල මණ්ඩල විසින් සමාලෝචිත වර්ෂය තුළ විසඳීමට තිබූ මුළු ආරවුල් සංඛ්‍යාව වූ 233,648ක් වූ අතර, එයින් නිරවුල්කර සහතික නිකුත්කළ මුළු ආරවුල් සංඛ්‍යාව 67,044ක් විය. එය ප්‍රතිශතයක් ලෙස සියයට 29ක් වැනි පහළ මට්ටමක පැවතුණු අතර, ඉන් නඩු කැඳවීම් කරන පාර්ශවකරුවන් නොපැමිණීම නිසා නිරවුල් නොකිරීම සිදුකළ ආරවුල් සංඛ්‍යාව 91,083කි.

(ඈ) සමථ මූල මණ්ඩල කොමිෂන් සභා රැස්වීම් සඳහා සාමාජිකයන්ගේ පැමිණීම පිළිබඳ පරීක්ෂාවේදී එහි සාමාජික පී.ඩී. විවේකනාදන් පුවිදරන් මහතාගේ සහභාගීත්වය අවම මට්ටමක පැවතුණි. 2024 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා පවත්වා තිබුණු රැස්වීම් 33න් රැස්වීම් 04කට පමණක් සහභාගී වී තිබූ අතර, රු.25,000 බැගින් වූ මාසික දීමනා මාස 04ක් වෙනුවෙන් ලබාගෙන තිබුණි.

(ඉ) සමථ මූල මණ්ඩල 329 අතරින් 2024 ජූනි 30 දිනට පෙර ධුරකාලය අවසන් වී ඇති ගැසට් කරන ලද මූල මණ්ඩල 175ක් සඳහා විගණිත දින වන විටත් පත්කිරීම් සිදුකර නොතිබුණි. මේ අතරින් සමථ මූල මණ්ඩල 72ක ධුරකාලය අවසන් වී වසර 03කට වැඩි කාලයක් ගතවී තිබුණි.

(ඊ) වැඩ තහනම් කළ නිලධාරීන් 04දෙනෙකුගෙන් හා සේවය හැරගිය නිලධාරීන් 02 දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.695,221ක් වූ ණයශේෂ වසර 05කට වැඩි කාලයක සිට අයනොවී පැවතුණි.

(උ) යාපනය දිස්ත්‍රික්කයේ වැසි ජලය එක්රැස් කිරීමේ ටැංකි 3000ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ඉන්දියානු රජය සහ ශ්‍රී ලංකා රජය අතර අවබෝධතා ගිවිසුම් අත්සන් නොකිරීම මත රුපියල් මිලියන 160ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. මේ වන විට ව්‍යාපෘති කාලය අවසන් වී තිබුණ ද, එහි භෞතික ප්‍රගතිය සියයට 22ක් වැනි අඩු මට්ටමක පැවතුණි.

(ඌ) රුපියල් මිලියන 300ක විදේශ ප්‍රදානය හා රු.500,000ක විදේශ මූල්‍යාකරණය මඟින් සමන්විත වූ නව සමාජ ඒකාබද්ධතා ව්‍යාපෘති යෝජනාව අනුමත නොවීම හේතුවෙන්, අමාත්‍යාංශය සමඟ ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම් අත්සන්කර නොතිබුණි.

යූ.එන්. අලුත්ගේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට(වැ.බ)

(19)A

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/A/CA/FA/2024/24

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 ජූනි 16 දින

ලේකම්

අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

ශීර්ෂය 228 - අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 228 - අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත [illegible] මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි ය [illegible] මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතා[illegible] සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර්16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කළින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.6.1 **මූල්‍ය නොවන වත්කම්**

මූල්‍ය නොවන වත්කම්වලට අදාළ SA 82 වගුවෙහි ගොඩනැගිලි හා නිලනිවාස තුළ 2024 වර්ෂයේ වැය විෂයයන් මගින් ගෙවූ රු.34,295,863ක වටිනාකම 2024 වර්ෂයේ කෙරිගෙන යන වැඩ - 9160හි ආරම්භක ශේෂය තුළ දක්වා තිබුණි.

2. **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **වියදම් කළමනාකරණය**

(අ) සමාලෝචිත වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන වැය විෂයයන් 03ක රු.1,844,770ක ප්‍රතිපාදන හා මූලධන වැය විෂයයන් 05ක රු.16,243,815ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර, එය සියයට 16 සිට 70ක පරාසයක විහිදී තිබුණි.

(ආ) 228-1-1-1-1503 රාජ්‍ය ආයතන වැය විෂයය වෙනුවෙන් පරිපූරක අයවැය ඇස්තමේන්තු මඟින් වෙන්කර තිබූ රු.880,000ක් වූ මුළු පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයම සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉතිරි වී තිබුණි.

3.2 **බැරකම් හා බැදීම්වලට එළඹීම**

වැය විෂයයන් 11කට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය රු.48,143,640ක් වූව ද, 2024 දෙසැම්බර් 31 දිනට රු.119,403,596ක බැරකම්වලට

එළැඹ තිබුණි. ඒ අනුව, ප්‍රතිපාදන ඉක්මවා එළැඹ තිබූ බැරකම් වටිනාකම රු.71,259,955ක් විය.

3.3 **නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

	නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	මූදල් රෙගුලාසි 104	2022 හා 2023 වර්ෂවලදී අනතුරට පත් වාහන 02ක ද, සමාලෝචිත වර්ෂයේ අනතුරට පත් වාහන 09ක ද, පරීක්ෂණ මණ්ඩල අවසන් වාර්තා ලබාදී නොතිබුණි.
(ආ)	මූදල් රෙගුලාසි 396	2024 දෙසැම්බර් 31 දිනට මහාධිකරණ කලාප 10කට අයත් අධිකරණ බැංකු ගිණුම් 23ක මාස 06 ඉක්ම වූ රු.1,831,753ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි.
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	දෙපාර්තමේන්තුවට අයත් වාහන 69ක් සඳහා ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.

3.4 තැන්පතු

සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රධාන කාර්යාලීය තැන්පතු ගිණුමෙහි පවතින ශේෂය රු.339,071,224ක් වන අතර, එහි කාලවිශ්ලේෂණයේදී වසර 02කට වැඩි හා වසර 05කට අඩු කාලසීමාවක සිට පවතින තැන්පතු ශේෂය රු.240,234,146ක් ද, වසර 05කට වැඩි කාලයක සිට පවතින ශේෂය රු.42,597,090ක් ද, විය.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

4.1.1 **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම**

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට මහාධිකරණවල විසඳීමට තිබූ විවිධ වර්ගවල නඩු ප්‍රමාණය 16,393ක් වූ අතර, වර්ෂය තුළදී නඩු 17,086ක් ගොනු වී තිබුණි. ඒ අනුව වර්ෂය තුළදී විසඳීමට තිබූ 33,479ක් වූ මුළු නඩු ප්‍රමාණයෙන් 16,295ක් විසඳා තිබුණ ද, දෙසැම්බර් 31 දින වන විට නඩු 17,184ක් විසඳීමට තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී නඩු විසඳීමේ ප්‍රගතිය සියයට 48ක මට්ටමක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී විසඳීමට තිබූ මුළු කම්කරු ආරවුල් ප්‍රමාණය 5974ක් වන අතර, වර්ෂය තුළදී ආරවුල් 2413ක් විසඳා තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය අවසන් දිනට විසඳීමට තිබූ ආරවුල් ප්‍රමාණය 3561ක් විය. සමාලෝචිත වර්ෂයේ කම්කරු ආරවුල් විසඳීම සියයට 40ක මට්ටමක පැවතුණි.

4.1.2 **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

අමාත්‍යාංශයේ අයවැය ප්‍රතිපාදන මත ආරම්භකර තිබූ නව අධිකරණ සංකීර්ණ ඉදිකිරීම හා පුළුල් කිරීම්, නිලනිවාස ඉදිකිරීම් හා ලේඛනාගාර ඉදිකිරීම් ව්‍යාපෘති 32ක් අයහපත් ආර්ථික තත්ත්වය, අමුද්‍රව්‍ය මිල ඉහළ යාම, මිල විචලන සීමා ඉක්මවීම වැනි හේතූන් මත කොන්ත්‍රාත්කරුවන් සමඟ අන්‍යොන්‍ය එකඟතාවය මත නතරකර තිබුණි. මෙම ව්‍යාපෘතීන් 32හි මුළු ඇස්තමේන්තුගත වටිනාකම රු.4,498,222,955ක් වන අතර, අවසන් කරන අවස්ථාව වන විට සමුච්චිත පිරිවැය රු.346,177,202 විය. මෙම ව්‍යාපෘති ඉටුකිරීමේ භෞතික ප්‍රගතිය සියයට 1 සිට සියයට 85ක මට්ටමක පැවතුණි.

4.2 **වත්කම් කළමනාකරණය**

(අ) මහනුවර අස්ගිරි ළමාගාර මාවතේ පිහිටි මහාධිකරණ විනිසුරු නිලනිවස නගර මධ්‍යයේ ඉතා ඉහළ වාණිජ වටිනාකමක් සහිත පර්වස් 40ක භූමි ප්‍රමාණයක පිහිටා තිබෙන අතර, මෙම නිලනිවස 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු කාර්යයකට භාවිතා නොකර වර්ෂ 05ක පමණ කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට තංගල්ල, බලපිටිය, හම්බන්තොට, හෝමාගම, ඇඹිලිපිටිය, කුරුණෑගල යන මහාධිකරණ පිහිටි අක්කර 4.86ක් වූ මුළු භූමි ප්‍රමාණය අමාත්‍යාංශය වෙත පවරාගෙන නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශය විසින් 2000 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලසීමාව තුළ නව අධිකරණ සංකීර්ණ ඉදිකිරීම හා පුළුල් කිරීම, නිලනිවාස ඉදිකිරීම් වැනි ව්‍යාපෘතීන් වෙනුවෙන් ලංකාවේ විවිධ ප්‍රදේශවලින් අක්කර 44ක් පමණ වූ ඉඩම් 25ක් අත්පත්කර ගැනීම ආරම්භ කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට සැලකිය යුතු කාලයක් ගත වී ඇති නමුත්, එම ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු අවසන් වී නොතිබුණි.

